

සිවිල් සමාජයට ප්‍රායෝගික මග පෙන්වීමක්

# එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය

UNITED NATIONS

UNITED NATIONS
HUMAN RIGHTS
OFFICE OF THE HIGH COMMISSIONER

# පටුන

1. මෙම මගපෙන්වීම ගැන ... 1

2. සිවිල් සමාජ ක්‍රියාකාරීන් සහ සිවිල් සමාජ අවකාශය ... 3

2.1 එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පද්ධතිය කෙටියෙන් ... 5

3. නිදහස් සහ ස්වාධීන සිවිල් සමාජ ක්‍රියාකාරිත්වය සඳහා වූ කොන්දේසි ... 7

3.1 හිතකර දේශපාලන සහ මහජන පරිසරයක් ... 7

3.2 සහයෝගී නියාමන රාමුවක් ... 8

3.3 තොරතුරු නිදහසේ ගලා යෑම ... 9

3.4 දීර්ඝ කාලීන සහාය සහ සම්පත් ... 9

3.5 සංවාදය සහ සහයෝගය සඳහා වූ පොදු අවකාශය ... 9

4. සිවිල් සමාජ ක්‍රියාකාරින් මුහුණ දෙන අභියෝග. ... 14

4.1 සිවිල් සමාජ වැඩ කටයුතුවලට බාධා කෙරෙන නීතිය හෝ නියමයන් පදනම් පියවර ... 14

4.2 හිතුවක්කාර පියවර ... 15

4.3 නීතියෙන් පරිබාහිර හිරිහැර කිරීම, බියවැද්දීම සහ පලිගැනීම් ... 16

5. මට කළ හැක්කේ කුමක් ද? එක්සත් ජාතීන් වෙත යොමුවීම ... 21

6. ප්‍රලේඛන සම්පත් ... 28

7. අප අමතන්න ... 29

සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගේ අධිෂ්ඨානය සහ කැපවීම, මටත් සමහර විට ඔබටත් නිහතමානි හැඟීමක් සහ විශාල සහ බලවත් ණයගැති බවක් පවතින්නේය යන අදහසක් හා සෑම මිනිසෙකුගේම සමාන වූ සහ අහිමි කළ නොහැකි ගරුත්වය සහ අයිතිවාසිකම් සඳහා දිගටම වැඩ කිරීමේ අවශ්‍යතාවයක් ඇති කරවයි.

සෙයිඩ් රාඩ් අල් හුසේන්
එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස්,
2014 ඔක්තෝබර්



# 1. මෙම මගපෙන්වීම ගැන

ප්‍රකාශ කිරීමේ, සංගම් පැවැත්වීමේ සහ සාමකාමීව රැස්වීමේ නිදහස සහ මහජන කටයුතුවලට සහභාගිවීමේ අයිතිය මිනිසුන්ට අදහස් හුවමාරු කර ගැනීමට, නව අදහස් ඇති කර ගැනීමට සහ තම අයිතිවාසිකම් ඉල්ලා සිටීමට අනෙකුත් අය සමග එකට එක් වීමට හැකි කරවන මානව අයිතිවාසිකම් ය. අප අපගේ ආර්ථික සහ සමාජ සංවර්ධනය පිළිබඳව දැනුවත් තිරණ ගනු ලබන්නේ මෙම මහජන නිදහස භුක්ති විඳීම තුළිනි. අපට සිවිල් ක්‍රියාකාරිත්වයේ නිරතවීමටත් ප්‍රජාතන්ත්‍රීය ජන සමාජ ගොඩ නැගීමටත් හැකි වන්නේ මෙම අයිතිවාසිකම් හරහාය. ඒවා සීමා කිරීමෙන් අපගේ සාමුහික ප්‍රගතියට බාධා පමුණුවයි.

මෙය මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලයේ (OHCHR) සිවිල් සමාජය සඳහා වූ මානව අයිතිවාසිකම් පිලිබඳ ප්‍රායෝගික මගපෙන්වීම් මාලාවේ හය වැන්නයි. එය OHCHR හි වත්මන් ප්‍රමුඛතා තේමාවන්ගෙන් එකක් වන 'ප්‍රජාතන්ත්‍රීය අවකාශය පුළුල් කිරීම' සමග සැලකිල්ලට ගත යුතුය.

මෙම මගපෙන්වීමෙන් සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගේ (CSA) වැඩ කටයුතුවලට අදාල ගැටලු ඉස්මතු කරයි. එය ඇරඹෙන්නේ 'සිවිල් සමාජය' සහ සිවිල් සමාජ අවකාශය' යන වදන් පිළිබඳව භාවිත නිර්වචනය කිරීම් සමගය. ඉන් පසුව ප්‍රකාශනයේ, සංගම් පැවැත්වීමේ සහ සාමකාමීව රැස්වීමේ නිදහස සහ මහජන කටයුතුවලට සහභාගිවීමේ අයිතිය සඳහා වූ අදාල අන්තර්ජාතික ප්‍රමිතීන් ඇතුළත් නිදහස් සහ ස්වාධීන සිවිල් සමාජයකට අවශ්‍ය කරන කොන්දේසි සහ පරිසරය ගැන සමස්ත දර්ශනයක් ඉදිරිපත් කරයි.

මෙම මගපෙන්වීමට ආණ්ඩුව සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් එකට එක්ව සියලු දෙනාගේ සියලු මානව අයිතිවාසිකම් ( සිවිල්, සංස්කෘතික, ආර්ථික, දේශපාලන සහ සමාජයීය) භුක්ති විඳීමේ ප්‍රගමනය සඳහා සිවිල් සමාජයට සිය වැඩ කටයුතු කිරීම සඳහා වූ අවකාශය වර්ධනය කර ගැනීමට වැඩ කළ ආකාරය පිළිබඳව සමහර නිදසුන්ද ඇතුළත්ය. සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට හිරිහැර කිරීම, බිය වැද්දීම හා පලි ගැනීම් ඇතුළත් සිවිල් සමාජ වැඩ කටයුතුවලට ඇති බාධා සහ සීමා හඳුනා ගැනීමක් ද මෙහි ඇතුළත්ය. සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට ප්‍රාදේශීය මට්ටමේ සිවිල් සමාජ අවකාශය ප්‍රවර්ධනය කිරීමට හා ආරක්ෂා කිරීමට එ ජා පද්ධතිය යොදා ගන්නා ලෙස මෙම මගපෙන්වීම ඔවුන්ගෙන් ඉල්ලීමක් කෙරේ. මූලාශ්‍ර සහ ඇමතීමේ විස්තර මෙම මගපෙන්වීම අවසානයේ දක්වා ඇත.

මෙම මගපෙන්වීම මූලික වශයෙන් යොමුව ඇත්තේ එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පද්ධතිය ගැන තවමත් හුරු පුරුදු නැති සමාජ ක්‍රියාකාරීන්ට සහාය වීම සඳහාය. එය සකස් කිරීම ආරම්භයේ සිටම විවිධ සමාජ ක්‍රියාකාරීන්ගේ අදහස් සහ උපදෙස්වලින් පෝෂණය විය.

# 2. සිවිල් සමාජ ක්‍රියාකාරීන් සහ සිවිල් සමාජ අවකාශය

නායකයන් තම ජනතාවට සවන් නොදෙන්නේ නම් එය ඔවුන්ට වීදිවලදී, මං සන්ධිවලදී හෝ අප බොහෝ විට දක ඇති ආකාරයට සටන් බිමේ දී සවන් දිමට සිදු වනු ඇත. ඊට වඩා හොඳ ක්‍රමයක් ඇත. ඒ වඩාත් වැඩි සහභාගිත්වය යි. වඩාත් වැඩි ප්‍රජාතන්ත්‍රවාදය යි. වඩාත් වැඩි හවුල් කර ගැනීම් සහ විවාත භාවයයි. ඉන් අදහස් වන්නේ සිවිල් සමාජය සඳහා උපරිම අවකාශයයි.

2013 සැප්තැම්බර් 23 සිවිල් සමාජයට සහාය දක්වීමේ ඉහළ මට්ටමේ රැස්වීමේ දී එ ජා මහ ලේකම් බැන් කිමුන් දක් වූ අදහස් වලින්

මෙම මගපෙන්වීමෙන් සිවිල් සමාජ ක්‍රියාකාරීන් නිර්වචනය කරනුයේ එක්සත් ජාතීන්ගේ අරමුණු, සාමය සහ ආරක්ෂාව පවත්වා ගැනිම, සංවර්ධනය සාක්ෂාත් කර ගැනිම සහ මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ ගරු කිරීමට අනුකූල වන පොදු වුවමනාවන්, පරමාර්ථ හෝ අගයන් වටා ක්‍රියාකාරිත්වයේ සහ මහජන සහභාගිත්වයේ ස්වේච්ඡාවෙන් නිරත වන පුද්ගලයන් හෝ කණ්ඩායම් ලෙසිනි.

අපගේ ජීවිත වැඩි දියුණු කිරීම සඳහා වූ එක්සත් ජාතීන්ගේ වැඩ කටයුතු මානව අයිතිවාසිකම් ගරු කිරීම මත පදනම් වේ. ඉහතින් නිර්වචනය කළ ආකාරයට සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගේ වැඩවල අන්තර්ගතයේ ස්වභාවයෙන් විවෘතව හෝ එසේ නොමැතිව අදහස් වන්නේ ද මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ ඊට ගරු කිරීමයි.

සිවිල් සමාජ ක්‍රියාකාරීහු අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් භාවය ප්‍රවර්ධනය කිරීම, ප්‍රජාවන්ට සිය ගැටලු ඉදිරිපත් කිරීමට සහායවීම, උපාය මාර්ග හැඩ ගැසීම, ප්‍රතිපත්ති සහ නීතිවලට බලපෑම් කිරීම සහ වගවීම ඉල්ලා සිටිම ප්‍රවර්ධනය කරති. මහජන ප්‍රතිපත්ති පිළිබඳව වඩාත් දැනුවත්ව තීරණය ගැනීම සඳහා සිවිල් සමාජ ක්‍රියාකාරීහු ප්‍රජාවන්ගේ අදහස් රැස්කොට ඉදිරිපත් කරති. සිවිල් සමාජ ක්‍රියාකාරීහු විවිධ පෙරමුණුවල අනතුරට ලක්වීමේ අවදානමක් ඇති ජනතාව සඳහා සේවා සැපයීමද සිදු කරති.

සෑම කෙනෙකුටම **තනිවම සහ අනෙකුත් අය සමග එක්ව** ජාතික සහ අන්තර්ජාතික මට්ටමේ දී මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස ආරක්ෂා කිරීම සහ සාක්ෂාත් කර ගැනීම ප්‍රවර්ධනයට සහ ප්‍රයත්න දැරීමට අයිතියක් ඇත්තේය. ( 1 වගන්තිය. අවධාරණය එක් කෙරිණ)

විශ්වීය වශයෙන් පිළිගත් මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස ප්‍රවර්ධනයට සහ ආරක්ෂා කිරීමට පුද්ගලයන්ගේ, කණ්ඩායම්වල සහ සමාජ ආයතනවල අයිතිය සහ වගකීම පිළිබඳ ප්‍රකාශනය ( මහා මණ්ඩල යෝජනා 53/ 144) සාමාන්‍යයෙන් මානව අයිතිවාසිකම් ආරක්ෂකයන් පිළිබඳ ප්‍රකාශනය යනුවෙන් හැඳින්වේ.

නිදසුනක් වශයෙන් සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට ඇතුළත් වන්නේ:[1]

- ජාලගත ක්‍රියාකාරීන් ඇතුළත් මානව අයිතිවාසිකම් ආරක්ෂකයන්.
- මානව අයිතිවාසිකම් සංවිධාන (රාජ්‍ය නොවන සංවිධාන, සංගම්, වින්දිතයන්ට ආධාර දීමේ කණ්ඩායම්)
- සභාග සහ ජාල (ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම්, ළමයින්ගේ අයිතිවාසිකම් හෝ පරිසර ගැටලු, ඉඩම් අයිතිවාසිකම්, LGBTi ආදිය වැනි)
- ආබාධයන් සහිත පුද්ගලයන් සහ ඔවුන්ගේ නියෝජන සංවිධාන
- ප්‍රජා මූලික සංවිධාන (ආදී වාසී ජනතාව, සුළුතර කණ්ඩායම්, ග්‍රාමීය ප්‍රජාව)
- ඇදහීම් පදනම් කණ්ඩායම් (පල්ලි, ආගමික කණ්ඩායම්)
- සංගම් (වෘත්තීය සමිති මෙන්ම ජනමාධ්‍යවේදීන්ගේ සංගම්, විනිසුරුවන්ගේ සහ නීතිඥයන්ගේ සහ අධිකරණ සංගම්, මහේස්ත්‍රාත් සංගම්, ශිෂ්‍ය සංගම්)
- සමාජ ව්‍යාපාර (සාම ව්‍යාපාර, ශිෂ්‍ය ව්‍යාපාර, ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාර)
- මානව අයිතිවාසිකම් භුක්ති විඳීමට සෘජුවම දායක වන වෘත්තිකයන් (මානුෂීය සේවකයන්, නීතිඥයන්, වෛද්‍යවරුන් සහ වෛද්‍ය සේවකයන්)
- මානව අයිතිවාසිකම් කඩ කිරීමේ වින්දිතයන්ගේ ඥාතීන් සහ සංගම්
- මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගත් ක්‍රියාකාරකම්වල යෙදෙන මහජන ආයතන (පාසල්, විශ්ව විද්‍යාල, පර්යේෂණ ආයතන)

සිවිල් සමාජ ක්‍රියාකාරීහු සමාජයට වැදගත් ප්‍රශ්න විසඳීමට සහ ගැටලු කෙරේ යොමු වීමට උත්සාහ කරති.

- දරිද්‍රතාවය, දූෂණය සහ ආර්ථික අසමානතාවය හා සටන් කිරීම
- සන්නද්ධ ගැටුම් ඇතුළත් මානුෂීය අර්බුදවලට ප්‍රතිචාර දැක්වීම
- නීතියේ ආධිපත්‍යය සහ වගවීම ප්‍රවර්ධනය
- මහජන නිදහස ප්‍රවර්ධනය කිරීම
- රාජ්‍ය අයවැය පාරදෘශ්‍ය භාවය වෙනුවෙන් පෙනී සිටීම
- පරිසරය ආරක්ෂා කිරීම
- සංවර්ධනයට ඇති අයිතිය සාක්ෂාත් කර ගැනීම
- සුළුතර සහ අවදානමට ලක්ව ඇති වෙනත් කණ්ඩායම්වලට අයත් පුද්ගලයන් බලගැන්වීම
- කුමන ආකාරයේ හෝ වෙනස් කොට සැලකීමට එරෙහිව සටන් කිරීම

[1] එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් වැඩ සටහන සමග වැඩ කිරීම, සිවිල් සමාජය සඳහා අත්පොතක් OHCHR, 2008, p vii.

- අපරාධ වැළැක්වීමට සහයෝගය දැක්වීම
- සමායතන සමාජ වගකීම සහ වගවීම ප්‍රවර්ධනය කිරීම
- මිනිස් ජාවාරමට එරෙහිව සටන් කිරීම
- ස්ත්‍රීන් බලගැන්වීම
- වෛරී කතාවලට එරෙහිවීම
- තරුණයන් බලගැන්වීම
- සමාජ යුක්තිය සහ පරිභෝගික ආරක්ෂාවේ ප්‍රගමනය
- සමාජ සේවා ලබා දීම

සමාජ ක්‍රියාකාරීහු ප්‍රාදේශීය, ජාතික, කලාපීය සහ අන්තර්ජාතික මට්ටම්වල ක්‍රියාත්මක වෙති.

සිවිල් සමාජ අවකාශය යනු සිවිල් සමාජ ක්‍රියාකාරීන් සමාජය තුළ හිමි කර ගන්නා ස්ථානයයි, සිවිල් සමාජය ක්‍රියාත්මක වන පරිසරය සහ ආකෘති රාමුවයි, සිවිල් සමාජ ක්‍රියාකාරීන් හා රාජ්‍යය, පුද්ගලික අංශය සහ පොදු ජනතාව අතර ඇති සම්බන්ධතාවයයි.

## 2.1 එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පද්ධතිය කෙටියෙන්

සාමය සහ ආරක්ෂාව තහවුරු කිරීමත් සමග ලොව පුරා සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමට වැඩ කිරීම සහ සියලු ජනතාවගේ සියලු මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම එක්සත් ජාතීන්ගේ මූලික පදනම් තුනයි. මෙය එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙන් සහ අන්තර්ජාතික නීතියෙන් ස්ථාපිත කර ඇත.

එක්සත් ජාතීන් මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීමට මූලික වශයෙන් මාර්ග තුනකින් ප්‍රයත්න දරයි.

1. එක්සත් ජාතින් තුළ මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීමට ක්‍රියා කරන ප්‍රධාන සංවිධානය වන්නේ එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය යි. (ධ්‍යකාෂා) එය මානව අයිතිවාසිකම් වැඩවල බලපෑම උපරිම කරනු සඳහා එක්සත් ජාතීන්ගේ විශේෂිත සංවිධාන, අරමුදල් සහ වැඩ සටහන් (ලෝක සෞඛ්‍ය සංවිධානය, එ ජා සරණාගත ඒජන්සිය, ඔහෂකෘ ජාත්‍යන්තර කම්කරු සංවිධානය, යුනෙස්කෝ වැනි) සමග සමීපයෙන් ක්‍රියා කරයි.
2. අන්තර්ජාතික මානව අයිතිවාසිකම් ගිවිසුම් (සන්ධාන සහ සම්මුතීන්) මානව අයිතිවාසිකම් පිළිබඳ බැඳීම් එක් එක් රටවල් ක්‍රියාත්මක කිරීම විධිමත්ව සහ කාලීනව සලකා බැලීමට ස්වාධීන විශේෂඥයන්ගේ මණ්ඩල සහ ගිවිසුම් ආයතන පිහිටුවයි.
3. මානව අයිතිවාසිකම් ගැටලු සහ තත්වයන් සාකච්ඡා කිරීමට එක්සත් ජාතින්ගේ සාමාජිකයන්ගෙන් සමන්විත අන්තර් ආණ්ඩු ආයතන හෝ එක්රැස්වීම්

පිහිටුවයි. මෙම කාර්ය සඳහා පිහිටුවා ඇති මූලික අන්තර් ආණ්ඩු ආයතනය වන්නේ වෙනත් ඒවා අතර විශේෂ ක්‍රියා පටිපාටි යනුවෙන් හැඳින්වෙන ස්වාධීන විශේෂඥයන්ගේ සහාය ලැබෙන මානව අයිතිවාසිකම් මණ්ඩලය සහ විශ්ව කාලීන පසුවිපරම යනුවෙන් හැඳින්වෙන යාන්ත්‍රණයයි.

මෙම අංශ තුන ස්වාධීන වන නමුත් එකිනෙකට අනුපූරක වේ.

මෙම මැන්ඩේට් බලතල සහ යාන්ත්‍රණ පිළිබඳ සවිස්තරාත්මක පැහැදිලි කිරීම් එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් වැඩ සටහනඃ සිවිල් සමාජය සඳහා අත් පොතේ ඇත. ( 6 වැනි කොටස මූලාශ්‍ර බලන්න.) මෙම අත්පොත එ ජා නිල භාෂා හයෙන්ම ඇත. දෘශ්‍ය සහ මුද්‍රිත අපහසුතා ඇති අය සඳහා Digital Accessible Information System (DAISY) CD Rom ප්‍රංශ සහ ඉංග්‍රීසි ආකෘතියෙන් ලබා ගත හැකිය.

එ ජා මානව අයිතිවාසිකම් යාන්ත්‍රණයේ ක්‍රියාකාරිත්වය සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගේ සහභාගිත්වයෙන් වඩාත් ශක්තිමත් වේ. සිවිල් සමාජය අන්තර්ජාතික මට්ටමේ දී දැනුවත් භාවය නගා සිටුවීම හා මානව අයිතිවාසිකම් ගැටලු සහ කඩ කිරීම් පිළිබඳව අධීක්ෂණයෙන් සහ වාර්තා කිරීමේ විශේෂඥතාවයෙන් දායක වේ. සිවිල් සමාජ ක්‍රියාකාරීන් මානව අයිතිවාසිකම් නව ප්‍රමිතීන්, යාන්ත්‍රණ සහ ආයතන ගොඩ නැගීමටත් මානව අයිතිවාසිකම් ගැටලු පිළිබඳව සම්පත් සහ මහජන සහාය පෙළ ගැසීමටත් සහාය වේ.

**එ ජා මානව අයිතිවාසිකම් මණ්ඩලයේ මුල පිරුම් සහ සිවිල් සමාජය**

එ ජා මානව අයිතිවාසිකම් මණ්ඩලය ප්‍රකාශ කිරීමේ නිදහස, සංගම් පැවැත්වීමේ සහ සාමකාමීව රැස්වීමේ නිදහස, බිය වැද්දීම් සහ පලිගැනීම් සහ මානව අයිතිවාසිකම් ආරක්ෂකයන් වැනි සිවිල් සමාජයට විශේෂයෙන් වැදගත් යෝජනා කීපයක් සම්මත කර ඇත. 2013 සහ 2014 දී ''සාමකාමී, සමෘද්ධිමත් හා ප්‍රජාතන්ත්‍රවාදී සමාජයන් සඳහා අත්‍යවශ්‍ය වූ සියලු මට්ටම්වල විනිවිද භාවය සහ වගවීම ඇතුළත් යහ පාලනය ප්‍රවර්ධනය කිරීමේ දි සහ පාලන ක්‍රියාවලියේ දී සිවිල් සමාජයේ ක්‍රියාකාරී සහභාගිත්වයේ වැදගත්කම පිළිගනිමින් යෝජනා 27/31 සහ 24/21 සම්මත කර ඇත.''

# 3. නිදහස් සහ ස්වාධීන සිවිල් සමාජ ක්‍රියාකාරිත්වය සඳහා වූ කොන්දේසි

නිදහස් හා ස්වාධීන සිවිල් සමාජයක් යනු ප්‍රාදේශයී, ජාතික හා ගෝලීය මට්ටම්වල සුවදායක ප්‍රතිචාරාත්මක පාලනයක පදනමයි.

2014 මාර්තු මස පැවති මානව අයිතිවාසිකම් මණ්ඩලයේ විසිපස් වැනි සැසියට මහ ලේකම් බැන් කිමූන් ගේ වීඩියෝ පණිවුඩයෙන්.

රාජ්‍යයන්ගේ අන්තර්ජාතික නීතිමය බැඳීම් අනුව තනි තනිව හෝ අනෙකුත් අය සමග එක්ව සිවිල් සමාජ ක්‍රියාකාරකම්වල යෙදීමට පුද්ගලයන්ගේ හැකියාව සහ ධාරිතාවට ක්‍රියාත්මකව සහාය දීමේ තත්වයන් ආර්ථික, දේශපාලන, සමාජයීය, සංස්කෘතික, නීතිමය නිර්මාණය කළ යුතු වන්නේය.

රාජ්‍ය බලධාරීන් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් අතර සම්බන්ධතාවය රාමු කරන මානව අයිතිවාසිකම් මූලධර්ම වන්නේ:

- **සහභාගිත්වය:** සමාජයේ සිවිල් සමාජ භූමිකාව පිළිගන්නා අතර සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට රාජ්‍ය බලධාරීන්ගේ ස්ථාවරවලට වෙනස් ස්ථාවර වෙනුවෙන් පෙනී සිටීමටත් ස්වාධීනව ක්‍රියාත්මක වීමටත් නිදහස ඇත්තේය.
- **වෙනස් කොට නොසැලකීම:** සියලු සමාජ ක්‍රියාකාරීන්ට කිසිදු ආකාරයේ වෙනස් කිරීමකින් තොරව මහජන ජීවිතයේ සහභාගිවීමට හැකියාව සලසා ඊට ආරාධනය කෙරේ.
- **ගරුත්වය:** රාජ්‍ය බලධාරීන් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් විවිධ භූමිකා ඉටු කරන අතර ජීවිත වැඩි දියුණු කිරීමේ පොදු අරමුණක් ඇත්තේය. මෙම සම්බන්ධතාවයට අන්‍යොන්‍ය ගරුත්වය අතිශයෙන් වැදගත් ය.
- **විනිවිද භාවය සහ වගවීම:** මහජන වුවමනාව සඳහා ක්‍රියා කිරීමේ දි රාජ්‍ය නිලධාරීන්ගෙන් විවෘත භාවය, වගකීම, පැහැදිලිකම, විනිවිද භාවය සහ වගවීම අපේක්ෂා කෙරේ. ඉන් සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගෙ න් එකිනෙකාට සහ මහජනතාවට විනිවිද භාවය සහ වගවීම ද අපේක්ෂා කෙරේ.

යහපත් භාවිතයට පදනම් වන මූලික කොන්දේසි වන්නේ:[2]

## 3.1 හිතකර දේශපාලන සහ මහජන පරිසරයක්:

**3.1 හිතකර දේශපාලන සහ මහජන පරිසරයක්:** සිවිල් සමාජ දායකත්වය අගය කරන සහ දිරිමත් කෙරෙන දේශපාලන සහ මහජන පරිසරයක්. භාවිතයේ දී ආයතන සහ රාජ්‍ය නිලධාරීන් සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට තම විධිමත් සම්බන්ධතාවයේ දී සංවේදී වන්නේය.

[2] මානව අයිතිවාසිකම් ආරක්ෂකයන්ගේ තත්වය පිළිබඳ විශේෂ සම්බන්ධීකාරකගේ වාර්තාව. මානව අයිතිවාසිකම් ආරක්ෂකයන් සඳහා ආරක්සිත සහ ඔවුන් ශක්තිමත් කිරිමේ පරිසරයක් A/HRC/25/55

**ටියුනිසියාව:** සිවිල් සමාජය මානව අයිතිවාසිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා අත්‍යාවශ්‍ය වූ නව නීති සහ ප්‍රතිපත්ති ගොඩනැගීමේ දී සහභාගිවීමෙන් නව ටියුනීසියාවක් ගොඩ නැගීම සඳහා මූලික භූමිකාවක් ඉටු කෙළේය. ප්‍රජාතන්ත්‍රීය පරිවර්තන සමයේ දී තමන් දරන අදහස් නිසා සිරගත කරන ලද පුද්ගලයන් නිදහස් කිරීමේ පොදු සමාව ලබා දීමේ නියෝගය සහ අන්තර්ජාතික ගිවිසුම් හතරක් ( සියලු පුද්ගලයන් බලහත් කාරයෙන් අතුරුදහන් කිරීමෙන් ආරක්ෂා කිරීම පිළිබඳ අන්තර්ජාතික සන්ධානය, සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික සන්ධානයේ වෛකල්පික මූල පත්‍රය, වධ හිංසා සහ අනෙකුත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම හෝ දඬුවම් වලට එරෙහි සන්ධානයේ වෛකල්පික මූල පත්‍රය සහ අන්තර්ජාතික අපරාධ අධිකරණයේ රෝම ව්‍යවස්ථාව) පිළිගැනීමේ නීති පිළිබඳව වැනි පළමු මූල පිරීම් සඳහා සිවිල් සමාජ සංවිධාන උපදේශන ලබා ගත්තේය. නව මැතිවරණ නීති සංග්‍රහයක් ප්‍රකාශයට පත් කළ අතිශයෙන් වැදගත් ප්‍රජාතන්ත්‍රීය ආයතන පිහිටුවීමේ දීත්, රාජ්‍ය නොවන සංවිධාන සඳහා රජයෙන් මෙන්ම විදෙස් රටවලින් අරමුදල් ලබා ගැනීම සඳහා ප්‍රතිපාදන ඇතුළත් සංගම් පැවැත්වීමේ නිදහස පිළිබඳ නව නිති සම්මත කර ගැනීමේ දී සිවිල් සමාජ සංවිධාන සහභාගි වූහ. 2011 සැප්තැම්බර් මස මෙම නිතිය සම්මත කර ගැනීමෙන් පසුව ටියුනීසියාවේ සංවිධාන දහස් ගණනක් පිහිටුවා ගන්නා ලදී. ටියුනීසියාවේ පවත්වන ලද ප්‍රථම ප්‍රජාතන්ත්‍රීය සහ විනිවිද භාවයෙන් යුත් ප්‍රථම ඡන්ද විමසීම වන 2011 ඡන්ද විමසීමේ දී සිවිල් සමාජ භූමිකාව මූලික වේ. අන්තර්ජාතික ප්‍රජාවේ සහාය ඇතිව ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය සඳහා පැවති ඡන්ද විමසීමේ දී ප්‍රථම වරට සිවිල් සමාජ ක්‍රියාකාරීන් 10,000 කට වැඩි ගණනක් ඡන්ද නිරීක්ෂණයට සහභාගි වූහ. සිවිල් සමාජ සංවිධාන විශේෂයෙන්ම ස්ත්‍රී සංවිධාන නව ව්‍යවස්ථා කෙටුම් පතට ස්ත්‍රීන් සහ පුරුෂයන් අතර පූර්ණ සමානත්වය ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටියහ. එම ව්‍යවස්ථාව 2014 ජනවාරි මස ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ අති මහත් බහුතරයකින් සම්මත විය.

සිවිල් සමාජ අවකාශය ප්‍රවර්ධනය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ වැදගත්කම පිළිබඳව මානව අයිතිවාසිකම් මණ්ඩලයේ පැවති සාකච්ඡා මණ්ඩපයේ සාරාංශය A/HRC/27/33.

## 3.2 සහයෝගී නියාමන රාමුවක්:

ව්‍යවස්ථා සම්පාදනය, පරිපාලන නියමයන් සහ භාවිතා අන්තර්ජාතික ප්‍රමිතීන් සහ සිවිල් සමාජ ක්‍රියාකාරකම් ආරක්ෂාවට අනුකූල විය යුතුය. සිවිල් සමාජ ක්‍රියාකාරීන් සඳහා යුක්තිය ප්‍රවේශ කිරීම, ස්වාධීන සහ ප්‍රබල ජාතික මානව අයිතිවාසිකම් ආයතන සහ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් යාන්ත්‍රණයන්ට පිවිසීම යන සියල්ල මෙම ආකෘති රාමුවට අන්තර්ගත වේ. ශක්තිමත් නීති සහ ප්‍රතිපත්ති අත්‍යාවශ්‍ය ය. එහෙත් නිසි පරිදි ක්‍රියාත්මක නොවන්නේ නම් ඒවා ඵල රහිතය.

ස්ලෝවීනියාවේ සංගම් පැවැත්වීමේ නිදහස යටතේ ලියා පදිංචි නොවූ සංගම් ඇතුළු සියලු සංගම්වලට ආරක්ෂාව සැලසෙන අතර ලියා පදිංචි නොවූ සංගම්වලට සම්බන්ධ පුද්ගලයන්ටත් සාමකාමී රැස්වීම් පැවැත්වීමට සහ සහභාගිවීම ඇතුළු ඕනෑම ක්‍රියාකාරකමක් කිරීමට නිදහස පවතී.

එ ජා විශේෂ සම්බන්ධීකාරකගේ සාමකාමී රැස්වීමට සහ සංගම් පැවැත්වීමට ඇති අයිතිය පිළිබඳ වාර්තාව A/HRC/20/27

ලෙබනනයේ සහ මොරොක්කෝවේ ව්‍යවස්ථා අනුව සිවිල් සමාජ සංවිධානවලට දේශීය සහ විදේශීය අරමුදල් ලැබීමට පෙර බලධාරීන්ගේ අනුමැතිය ලබා ගත යුතු නැත.

එ ජා විශේෂ සම්බන්ධීකාරකගේ සාමකාමී රැස්වීමට සහ සංගම් පැවැත්වීමට ඇති අයිතිය පිළිබඳ වාර්තාව A/HRC/20/27

**3.3 තොරතුරු නිදහසේ ගලා යෑම:** සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට ගැටලු ගැන දැනුවත්වීමට සහ දැනගෙන සිටීමට, උනන්දුවන කරුණු ගැන කතා කිරීමට, නිර්මාණාත්මකව සහභාගිවීමට සහ විසඳුම්වලට දායකවීම සඳහා අදහස්, දත්ත, වාර්තා, මුලපිරුම් සහ තීරණ නිදහසේ ලබා ගැනීමට හැකි විය යුතුය.

**3.4 දීර්ඝ කාලීන සහාය සහ සම්පත්:** කොන් කරනු ලැබූ හඬ ( පුද්ගලයන්ගේ) හැකියාවන් ගොඩ නැගීමේ පියවර සහ සියලු සමාජ ක්‍රියාකාරීන් සඳහා සම්පත්, රැස්වීම් ස්ථාන සහ තාක්ෂණය ලබා ගැනීම සහතික කිරීම.

ක්‍රොඒසියාවේ ආණ්ඩුව සංගම්වල වැඩ සටහන් සහ ව්‍යාපෘති සඳහා ආණ්ඩුවේ ප්‍රදාන වෙන් කිරීමේ යහපත් භාවිතා, ප්‍රමිතීන් සහ නිර්ණායක පිළිබඳ නීති සංග්‍රහයක් සම්මත කෙළේය. (2007) ඉන් රාජ්‍ය අරමුදල් බෙදා හැරීමේ දී ආණ්ඩුවේ සියලු මට්ටම්වල බලධාරීන් සඳහා විනිවිද භාවයෙන් යුත්, මූලික, නියමයන් සහ ක්‍රියා පටිපාටි නියම කෙරේ.

ලාභ ඉපැයීම සඳහා නොවන නීතිය, යුරෝපීය කේන්ද්‍රය (ECNL) සිවිල් සමාජ සංවිධාන සඳහා රාජ්‍ය අරමුදල්, යුරෝපීය සංගමයේ සහ බටහිර බෝල්කන්ස් හි යහපත් භාවිතා 2011

**3.5 සංවාදය සහ සහයෝගය සඳහා වූ පොදු අවකාශය:** තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී සිවිල් සමාජ සංවිධාන සඳහා අවකාශයක් ලබා දීම.

**මාලදිවයින** 2014 දී කලාපීය රාජ්‍ය නොවන සංවිධාන සහ අන්තර්ජාතික සංවිධාන සමග එක්ව ඉස්ලාමීය ආකෘති රාමුවක් තුළ ස්ත්‍රී පුරුෂ සමානත්වය සාක්ෂාත් කර ගැනීම පිළිබඳ කලාපීය අත්දැකීම් හුවමාරු කර ගැනීමට හා සාකච්ඡා කිරීමට ස්ත්‍රී අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින්නන් සඳහා දින පහක සාකච්ඡා මණ්ඩපයකට සහාය ලබා දුන්නේය.

**මැක්සිකෝව** 2012 දී මානව අයිතිවාසිකම් ආරක්ෂකයන්ට සහ ජනමාධ්‍යවේදීන්ට ඇති තර්ජන ගැන ක්‍රියා කිරීමට ජාතික යාන්ත්‍රණයක් සැලසීම සඳහා මානව අයිතිවාසිකම් ආරක්ෂකයන් ගේ සහ ජනමාධ්‍යවේදීන් ගේ ආරක්ෂාව සඳහා වූ නීතියක් සම්මත කෙළේය. මෙම නීතිය කෙටුම්පත් කරන ලද්දේ අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන සහ සංවිධාන සහ මැක්සිකෝවේ මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ සහාය ඇතිව සිවිල් සමාජ ක්‍රියාකාරීන් සහභාගිත්වයෙන් යුත් කොංග්‍රසයෙනි.

**නේපාලය** 2010 දී කුල පදනම් වෙනස්කොට සැලකීම සහ හීන කුල පනත සිවිල් සමාජය, ජාතික දලිත් කොමිසම සහ මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ දේශීය කාර්යාලයේ සහභාගිත්වයෙනි. මෙම පනත 2011 මැයි මස සම්මත කෙරිණ.

**නවසීලන්තය** 2011 දී ආබාධිත පුද්ගලයන්ගේ සංගමයේ සහභාගිත්වය ඇතිව ආබාධිත පනත කෙටුම්පත් කරන ලදී.

එ ජා විශේෂ සම්බන්ධීකාරකගේ සාමකාමී රැස්වීමට සහ සංගම් පැවැත්වීමට ඇති අයිතිය පිළිබඳ වාර්තාව A/HRC/20/27

**වනෝටු** 2013 දී ආණ්ඩුව ඔජසෘ කොමිටිය පත් කෙළේය. එහි උප සභාපති තනතුර නියෝජනය කරන්නේ වනෝටු රාජ්‍ය නොවන සංවිධාන සංගමයෙනි. ඊට අමතරව සිවිල් සමාජ සංවිධාන වනෝටු හි මානව අයිතිවාසිකම් වාර්තා කිරීමේ වගකීම් සම්බන්ධීකරණයට සහ ජාතික මානව අයිතිවාසිකම් ආයතනයක් පිහිටුවීමට මැන්ඩේට් බලය හිමි ආයතනය වන ජාතික මානව අයිතිවාසිකම් කොමිටියේ (භාසෘක) ද නියෝජනය වේ. 2013 දී ආබාධයන් සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ කොමිටියට ඉදිරිපත් කරන වාර්තාව කෙටුපත් කිරීමේ දී ආබාධයන් සහිත පුද්ගලයන් සමග වැඩ කරන සංවිධානවල උපදේශන පුළුල් වශයෙන් ලබා ගන්නා ලදී.

## සිවිල් සමාජ වැඩ කටයුතු පිළිබඳ අන්තර්ජාතික නෛතික රාමුව

සිවිල් සමාජ වැඩ සඳහා වූ ආරක්ෂිත සහ ශක්තිමත් පරිසරයකට අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය මත පදනම් වූ ප්‍රබල ජාතික නෛතික ආකෘති රාමුවකින් සහාය ලැබිය යුතුය.

ප්‍රකාශ කිරීමේ, සංගම් පැවැත්වීමේ, සාමකාමී රැස්වීමේ නිදහස සහ මහජන කටයුතුවල සහභාගිවීමේ අයිතිය සාධනීය වෙනසක් සඳහා ජනතාව බල මුලු ගැන්වීමට හැකි කරවන අයිතීන් ය. සෑම කෙනෙකුම තනිවම හෝ අනෙකුත් අය සමග එක්ව මෙම අයිතීන් භුක්ති විඳිය යුතුය. ඒවා සිවිල් සමාජ ක්‍රියාකාරිත්වයට කේන්ද්‍රීය වේ.

මානව අයිතිවාසිකම් ගිවිසුම් බොහොමයකට කේන්ද්‍රීය වන්නේ මහජන නිදහස ආරක්ෂා කිරීමට සෘජුවම අදාල ප්‍රතිපාදන ය. වෙනස් කොට නොසැලකීමේ මූලධර්මය මේ සියල්ලට ඇතුළත් වේ.

- විශ්ව මානව අයිතිවාසිකම් ප්‍රකාශනය (19, 20, 21 වගන්ති)
- සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සන්ධානයෙන් අදහස් සහ ප්‍රකාශ කිරීමේ, සාමකාමී රැස්වීමේ සහ සංගම් පැවැත්වීමේ සහ මහජන කටයුතුවල සහභාගිවීමේ නිදහසට ඇති අයිතිය ලබා දේ. (19, 21, 22, 25 වගන්ති)
- ආර්ථික, සමාජයිය සහ සංස්කෘති අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සන්ධානයෙන් වෘත්තීය සමිති ගොඩ නැගීමට සහ ඊට සහභාගිවීමේ සහ සංස්කෘතික කටයුතුවල සහභාගිවීමේ අයිතිය ලබා දේ. (8.15 වගන්ති)
- ස්ත්‍රීන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස් කොට සැලකීම් තුරන් කිරීම පිළිබඳ අන්තර්ජාතික සන්ධානයෙන් ස්ත්‍රීන්ට දේශපාලන, ආර්ථික සහ සංස්කෘතික ජීවිතයට සහභාගිවීමේ අයිතිය ලබා දේ. (3 වගන්තිය)
- වාර්ගික වෙනස් කොට සැලකිම තුරන් කිරීම පිළිබඳ අන්තර්ජාතික සන්ධානයෙන් ප්‍රකාශ කිරීම, රැස්විම සහ සංගම් පැවැත්වීමට හා මහජන කටයුතු පැවැත්විමට අදාල වෙනස් කොට සැලකිම් තහනම් කරයි. (5 වගන්තිය)
- ළමයාගේ අයිතිවාසිකම් පිළිබඳ සන්ධානයෙන් ප්‍රකාශ කිරීමේ, සංගම් පැවැත්විමේ සහ සාමකාමී රැස්වීමේ නිදහස තහවුරු කරයි. (13, 15 වගන්ති)
- ආබාධයන් සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සන්ධානයෙන් මතයක් දැරීමේ සහ ප්‍රකාශ කිරීමේ නිදහසට සහ තොරතුරු ලබා ගැනිමට, දේශපාලන සහ මහජන කටයුතුවල යෙදිමට මෙන්ම සංස්කෘතික කටයුතුවල යෙදීමේ අයිතීන් තහවුරු කරයි. (21, 29, 30 වගන්ති)
- සියලු පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමට එරෙහිව ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සන්ධානයෙන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම සිදු වූ වාතාවරණය තහවුරු කර ගැනීමට හා අතුරුදහන් කළ පුද්ගලයන්ගේ ඉරණම සහ බලහත්කාරයෙන් අතුරුදහන් කළ වින්දිතයන්ට සහායවීම සඳහා නිදහසේ සංවිධානයවිමට සහ සංගම් පැවැත්වීමට සහභාගිවීමේ සහ ඒවා ගොඩ නැගීමේ අයිතිය තහවුරු කරයි. (24 වගන්තිය) සහ
- සියලු සංක්‍රමණික සේවකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් ආරක්ෂා කිරීමේ අයිතිය පිළිබඳ අන්තර්ජාතික සන්ධානය සංගම් පැවැත්විමට ඇති අයිතිය තහවුරු කරයි. (26 වගන්තිය)

ප්‍රකාශ කිරීමේ, සංගම් පැවැත්වීමේ සහ සාමකාමී රැස්වීමේ නිදහස සහ මහජන කටයුතුවල සහභාගිවීමේ අයිතිය සිවිල්, සංස්කෘතික, ආර්ථික, දේශපාලන සහ සමාජ අයිතීන් ගණනාවක් භාවිතා කිරීමේ පදනමක් වේ. ඉන් වඩාත් හොඳ සමාජයිය වෙනසක් ඇති කිරිම සඳහා ක්‍රියාකාරකම්වල නිරතවිමට ස්ත්‍රීන්, පුරුෂයන් සහ ළමයින් බල ගැන්වේ.

**ප්‍රකාශ කිරීමේ නිදහස:** ප්‍රකාශ කිරීමේ නිදහසට තොරතුරු සහ අදහස් සෙවීමේ, ලබා ගැනීමේ සහ ලබා දීමේ අයිතිය ඇතුළත් වේ. ඊට දේශපාලන හා ආගමික කතිකා, මහජන කටයුතු, මානව අයිතිවාසිකම් මෙන්ම සංස්කෘතික සහ කලාත්මක ප්‍රකාශන පිළිබඳ තොරතුරු සහ අදහස් ද ඇතුළත් වේ. එහි විෂය පථය සීමා කිරීම්වලට යටත්ව ( වෙනස් කොට සැලකීම, එදිරිවාදිකම හෝ ප්‍රචණ්ඩත්වයට උසි ගැන්වීම ඇතුළත් ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය ඇති කිරීම තහනම් කෙරෙන රබාත් ක්‍රියාත්මක සැලැස්ම, 2012 ඔක්තෝබර් 5, බලන්න.) බලවත් පහරදීමක් ලෙස සැලකිය හැකි ප්‍රකාශන ද ඇතුළත්ය. සියලු ආකාරයේ ප්‍රකාශන සහ ඒවා පතුරුවා හැරීම ආරක්ෂා කෙරේ: වචනයෙන්, ලේඛනයෙන් සහ සංඥා භාෂාවෙන් සහ කලාත්මක දර්ශන සහ දේවල් වැනි වචනයෙන් නොවන ප්‍රකාශන. ප්‍රකාශනය, පොත්වලින්, පුවත් පත් තුළින්, පත්‍රිකා තුළින්, පෝස්ටර්, කාටූන්, බැනර්, ඇඳුම් සහ නෛතික සැල කිරීම්වලන් කළ හැකිය. ඊට සියලු ආකාරයේ ශ්‍රව්‍ය දෘශ්‍ය මෙන්ම ඉලෙක්ට්‍රොනික සහ අන්තර්ජාලය පදනම් ප්‍රකාශන ආකාරයන් ඇතුළත් ය.

**සංගම් පැවැත්වීමේ නිදහස:** සංගමයක් යන්නෙන් පොදු වුවමනා ඇති ක්ෂේත්‍රයක සාමූහිකව ක්‍රියා කරන, ප්‍රකාශ කරන, ප්‍රවර්ධනය, නිරතවීම හෝ ආරක්ෂා කරන කිසියම් පුද්ගලයන් කණ්ඩායමක් හෝ සංයුතියකි. සිවිල් සමාජ සංවිධාන, සමාජ, සමුපකාර, රාජ්‍ය නොවන සංවිධාන, ආගමික සංවිධාන, දේශපාලන පක්ෂ, වෘත්තීය සමිති, පදනම් හෝ ජාලස්ත සංගම් වලට බැඳීම සහ සහභාගිවීම හෝ සහභාගි නොවීමට තිරණය කිරීම ඇතුළත්ය. සම්පත් සොයා ගැනීම, ලබා ගැනීම සහ භාවිතය කෙතරම් කුඩා වුවත් කිසියම් සංගමයක පැවැත්මට සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක වීමට අත්‍යාවශ්‍යය. සංගම් පැවැත්වීමේ නිදහසට දේශීය, විදේශීය සහ අන්තර්ජාතික මූලාශ්‍රවලින් සම්පත්, මානව, භෞතික සහ මූල්‍ය, සෙවීම, ලබා ගැනීම සහ භාවිතය ඇතුළත්ය.'' (A/HRC/23/39, para 8)

**සාමකාමී රැස්වීමේ නිදහස:** සාමකාමී රැස්වීම යනු නිශ්චිත කාර්යක් සඳහා පුද්ගලික හෝ ප්‍රසිද්ධ ස්ථානයක තාවකාලිකව, අවිහිංසාවාදිව එක්රැස්වීමය. ඊට උද්ඝෝෂණ කිරීම, වැඩ වර්ජන, පෙළපාළි, රැස්වීම් සහ සත්‍යග්‍රහ ඇතුළත් ය.

**මහජන කටයුතුවල සහභාගිවීමේ අයිතිය:** මහජන කටයුතු පැවැත්වීම යනු විශේෂයෙන්ම ව්‍යවස්ථා, විධායක සහ පරිපාලන බලතල භාවිතා කිරීමේ දේශපාලන බලයට ආදාල පුළුල් සංකල්පයකි. ඊට රාජ්‍ය පරිපාලනයේ සියලු ලක්ෂණ සහ අන්තර්ජාතික, ජාතික, කලාපීය සහ ප්‍රාදේශීය මට්ටම්වල ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ඇතුළත්වේ. සහභාගිවීම නිදහසේ තෝරා ගත් නියෝජිතයන් හරහා හෝ සෘජුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්මත කිරීම හෝ වෙනස් කිරීම, නීති කෙටුම්පත් කිරීම සහ ප්‍රතිපත්ති සංවර්ධනය, ජනමත විමසුමක් තුළින් මහජන ගැටලු ගැන තීරණ ගැනීම, ප්‍රදේශීය ගැටලු පිළිබඳව තීරණය ගැනීමේ බලතල සහිත ජන සභාවලට සහභාගිවීම ආකාරයෙන් විය හැකිය. මහජන කටයුතුවල සහභාගිවීමේ අයිතියට දේශපාලන සහ මහජන කටයුතු පිළිබඳව අවධානය යොමු වූ සංවිධාන හෝ සංගම් ගොඩ නැගීම සහ එක්වීමේ අයිතිය ඇතුළත් සංගම් පැවැත්වීමේ අයිතිය අත්‍යාවශ්‍ය ය.

**වෙනස් කොට නොසැලකීම:** ඉහත සඳහන් අයිතිවාසිකම් සියලුම පුද්ගලයන්ට, වර්ගය, වර්ණය, ලිංග භේදය, භාෂාව, ආගම, දේශපාලන හෝ වෙනත් මත දැරීම,

ස්ත්‍රී පුරුෂ භාවය මත අනන්‍යතාවය, ජාතික හෝ සමාජ ප්‍රභවය, දේපොළ, උපත හෝ වෙනත් තත්වයන් වැනි කිසිම ආකාරයක වෙනස් කමකින් තොරව තහවුරු කළ යුතුය. මෙම අයිතිවාසිකම් ස්ත්‍රීන්ට, ළමයින්ට, ආදිවාසී ජනතාවට, ආබාධයන් සහිත පුද්ගලයන්ට, සුළුතර කණ්ඩායම් හෝ කොණ් කිරීමේ හෝ බැහැර කිරීමේ අවදානමක් ඇති කණ්ඩායම්වලට, තම ලිංගික නැඹුරුව සහ ස්ත්‍රී පුරුෂ භාවය මත අනන්‍යතාවය, ජාතියට අයත් නොවීම නිසා වෙනස් කොට සැලකීමට ලක් වෙන වින්දිතයන් ඇතුළුව රටක් නැති පුද්ගලයන්, සරණාගතයන් හෝ සංක්‍රමණිකයන් මෙන්ම ලියා පදිංචි නොකළ කණ්ඩායම් ඇතුළු සංගම් වලටද අදාල වේ.

මෙම අන්තර්ජාතික ප්‍රමිතීන් රාජ්‍යයේ සියලු අංශවලට, විධායක, ව්‍යවස්ථාදායක සහ අධිකරණ, ජාතික, කලාපිය හෝ ප්‍රදේශීය වැනි කුමන මට්ටමක හෝ අනෙකුත් මහජන හෝ රාජ්‍ය බලධාරීන්ට අදාල වන්නේය. රාජ්‍යය, පුද්ගලයන් මෙම නිදහස භුක්ති විඳීම හානි කරන පුද්ගලයන්ගේ හෝ සංයුතීන්ගේ ක්‍රියාවලින් ඔවුන් ආරක්ෂා කළ යුතුය. මෙම අයිතීන් භුක්ති විඳීම ප්‍රවර්ධනය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ මූලික වගකීම රාජ්‍යය සතු විය යුතුය.

ප්‍රකාශ කිරීමේ, සංගම් පැවැත්වීමේ සහ සාමකාමීව රැස්වීමේ නිදහස සමග විශේෂ යුතුකම් සහ වගකීම් බැඳී පවතින අතර ඒවා භාවිත කිරීම සමහර සීමා කිරීම්වලට යටත් වේ. කිසියම් සීමා කිරීමක් වන්නේ නම් ඊට නීති ප්‍රතිපාදන තිබිය යුතු අතර අනෙකුත් අයගේ අයිතිවාසිකම් සහ කීර්තිය ආරක්ෂා වන හෝ ජාතික ආරක්ෂාව හෝ මහජන සාමය (ordre public) හෝ මහජන සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීමට දැඩි සෙයින් අවශ්‍ය ප්‍රමාණයට විය යුතුය. මෙම හේතු කිසි විටෙකත් බහු පාර්ශ්වීය ප්‍රජාතන්ත්‍රවාදය, ප්‍රජාතන්ත්‍රීය මූලධර්ම සහ මානව අයිතිවාසිකම්වලට සීමා පැනවීමට යොදා නොගත යුතුය.

මානව අයිතිවාසිකම් කොමිටිය, පොදු අදහස් දැක්වීම් අංක 34, අදහස් දැරීමේ සහ ප්‍රකාශනයේ නිදහස, CCPR/C/GC/34 සහ පොදු අදහස් දැක්වීම් අංක 25 වගන්තිය 25 : මහජන කටයුතුවල සහභාගිවීමේ අයිතිය, CCPR/C/21/Rev.1/Add.7 සාමකාමී රැස්වීමේ සංගම් පැවැත්වීමේ නිදහසට ඇති අයිතිය පිළිබඳ එ ජා විශේෂ සම්බන්ධීකාරකගේ වාර්තා, A/HRC/20/27; A/HRC/23/39.

"ආණ්ඩු ඇතුළුව අපි කිසිවෙක් තනිවම, අප විසඳීමට යන ප්‍රශ්නවල මූලයන් දන්නේ හෝ ඒවාට හේතු සාධක හෝ හොඳම විසඳුම් හෝ නොදන්නෙමු. සාමූහික දැනුමෙන් අප සියලු දෙනාටම පලප්‍රයෝජනයක් අත් වනු ඇත. එමනිසා තීරණයක් ගැනීමට පෙර සියලු පාර්ශ්වයන්ගේ, විශේෂයෙන්ම කොණ් කරනු ලැබුවන්ගේ හඬට සවන් දීම අපට වැදගත් ය. නිදසුනක් වශයෙන් මානව අයිතිවාසිකම් කොමිටිය මූලාශ්‍ර ගණනාවකින්, ආණ්ඩුවලින්, එක්සත් ජාතීන්ගෙන් සහ සිවිල් සමාජයෙන් තොරතුරු රැස්කර ගනී. එය ආණ්ඩු විසින් අපරානුමත කරන ලද මානව අයිතිවාසිකම් ගිවිසුම් යටතේ ඇති තම බැඳීම්වලට අනුකූල වන සේ තම නීති සහ භාවිතා සකස් කිරීමට ආණ්ඩු විසින් ගත යුතු ප්‍රායෝගික පියවර සැලසුම් කිරීමට ඉවහල් වන අපගේ අවසාන නිරීක්ෂණ සහ නිර්දේශ සකස් කිරීමට ඉවහල් වේ.


මහාචාර්ය සර් නයිගල් රැඩ්ලි,
සභාපති,
එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කොමිටිය, 2014 ඔක්තෝබර්

# 4. සිවිල් සමාජ ක්‍රියාකාරින් මුහුණ දෙන අභියෝග.

සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට ප්‍රාදේශීයව, ජාතිකව කලාපීයව හෝ ගෝලීය වශයෙන් ආණ්ඩුවේ ස්ථාවරය, ප්‍රතිපත්ති හෝ ක්‍රියාවන් විවේචනය කිරීම හෝ විරුද්ධවීම නිසා ඔවුන්ගේ නිත්‍යානුකූල වැඩ කටයුතුවල බලපෑම වැළැක්වීම, අවම කිරීම, නතර කිරීම හෝ ආපසු හැරවීම අරමුණු කර ගත් බාධකවලට මුහුණ දීමට සිදු වනු ඇත.

ඊට සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට එරෙහිව නිදහස හා ස්වාධීනත්වය කෙරේ පැනවෙන සීමාවන් හෝ හිරිහැර කිරීම්, බියවැද්දීම් සහ පලිගැනීම් ( එනම් දඬුවම් කිරීම් හෝ එකටෙක කිරීම්) ඇතුළත් විය හැකිය.

## සිවිල් සමාජ වැඩ කටයුතුවල සිදුවන බලපෑම වැළැක්වීම, අවම කිරීම, නතර කිරීම හෝ ආපසු හැරවීමේ ආකාරයන්.




## 4.1 සිවිල් සමාජ වැඩ කටයුතුවලට බාධා කෙරෙන නීතිය හෝ නියමයන් පදනම් පියවර

නීති සහ නියමයන් මගින් සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගේ නිදහස සහ ස්වාධීනත්වය සීමා කළ හැකිය. නිදසුන් වශයෙන්:

- සාධනීය ප්‍රතිලාභයක් නැතිව ලියා පදිංචි විය යුතු බව නියම කිරීම

- කළ හැකි ක්‍රියාකාරකම් වර්ග සීමා කිරීම
- ලියා පදිංචි නොකළ ක්‍රියාකාරකම් සඳහා අපරාධ දඬුවම් නියම කිරීම
- අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන හෝ විදේශීය අරමුදල් ලබන සංවිධාන හෝ මානව අයිතිවාසිනම් පිළිබඳව වැඩ කරන කණ්ඩායම් ඇතුළුව විශේෂිත සංවිධාන ලියා පදිංචි කිරීමේ සීමාවන් නියම කිරීම.
- සිදු කළ හැක්කේ කවර ක්‍රියාකාරකම් ද හෝ කවුරුන් විසින්ද යන්න පිළිබඳ නිර්ණායක දැක්වීම හෝ එම ක්‍රියාකාරකම් සීමා කිරීම
- මූල්‍ය මූලාශ්‍ර සීමා කිරීම (විදෙස් මූලාශ්‍ර වැනි) සහ
- සාමකාමී රැස්වීම, සංගම් පැවැත්වීම සහ ප්‍රකාශන නිදහස පාලනය කෙරෙන හෝ සමහර කණ්ඩායම් මත අසමානව නිෂේධනීය බලපෑමක් ඇති කෙරෙන වෙනස් කොට සැලකීමේ ප්‍රතිපාදන ඇතුළත් ව්‍යවස්ථා පැනවීම

ඊට අමතරව සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට සිය වැඩ කටයුතු සිදු කිරීම වැළැක්වීම හෝ ප්‍රමාද කළ හැකි පරිපාලන ක්‍රියා පටිපාටි සහ අභිමතානුකූල පියවර ගැනීම.

තොරතුරු ලබා ගැනීමේ නිදහසට ඇති අයිතිය සීමා කළ විට සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට ප්‍රතිපත්ති සම්පාදන ක්ෂේත්‍රයේ ඵලදායී මැදිහත්වීමකට ඇති හැකියාව අඩු කෙරේ. තීරණ ගැනීමේ ක්‍රියාවලියට අනවශ්‍ය ආකාරයේ පටු හෝ සහභාගී වන ආකාරයේ දැඩි සීමාවන් ( සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට පැනවෙන 'නිරීක්ෂණ මට්ටම' හෝ කතා කිරීමේ අයිතිය සීමා කිරීම වැනි) සහභාගිවීමට ඇති බාධකයන් වේ. අන්තර්ජාතික මට්ටමේ දී යෙදෙන සංගම් පැවැත්වීමේ නිදහස පිළිබඳ ප්‍රමිතීන් ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ දී ද යෙදේ.[3]

## 4.2 හිතුවක්කාර පියවර

සිවිල් සමාජය ආණ්ඩුවේ ස්ථාවරය, ප්‍රතිපත්ති සහ ක්‍රියා විවේචනය කරන විට හෝ ඊට විරුද්ධ වන විට නීතියේ එතරම් පැහැදිලි නැති ප්‍රතිපාදන නිත්‍යානුකූල සහ සුජාත භාවයේ මුවාවෙන් හිතුවක්කාර ලෙස යෙදිය හැකිය. ( මුදල් විශෝධනය, ත්‍රස්ත විරෝධී, ජාතික ආරක්ෂාව, මහජන සදාචාරය, අපහාස කිරීම, ජාතික ස්වෛරීත්වය ආරක්ෂා කිරීම වැනි හේතු දක්වා)

- කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය හිතුවක්කාර ලෙස පරීක්ෂා කිරීම
- ලියා පදිංචිය අහෝසි කිරීම හෝ එසේ කරන බවට තර්ජකය කිරීම
- කාර්යාලය බලහත්කාරයෙන් වැසීම
- දේපොළ පරීක්ෂා කිරීම හා අත් අඩංගුවට ගැනීම
- අසාධාරණ දඩ
- සාවද්‍ය අභිචෝදනා

---

[3] බහු පාර්ශ්වීය ආයතන සන්දර්භයක් තුළ සාමකාමී රැස්වීම සහ සංගම් පැවැත්වීම භාවිතා කිරීමේ දී සාමකාමී රැස්වීමේ සහ සංගම් පැවැත්වීමේ නිදහසට ඇති අයිතිය පිළිබඳ එ ජා විශේෂ සම්බන්ධීකාරකගේ වාර්තාව A/69/365.

- හිතුවක්කාර ලෙස අත්අඩංගුවට ගැනීම සහ රඳවා ගැනීම
- සංචාරය කිරීම පිළිබඳව පැනවෙන තහනම්
- ජාතිකත්වය අහෝසි කිරීම
- විරෝධතා හෝ රැස්වීම් හිතුවක්කාර ලෙස සීමා කිරීම හෝ අවලංගු කිරීම

ආරක්ෂිත සහ ශක්තිමත් සිවිල් සමාජයක් නීතියෙන් සහ භාවිතයෙන් නිර්මාණය කිරීම සහ පවත්වා ගැනීම පිළිබඳ එ ජා මානව අයිතිවාසිකම් මණ්ඩලයේ යෝජනා අංක 24/21 මෙසේ සඳහන් කරයි: ''සමහර අවස්ථාවල දේශීය නෛතික හා පරිපාලන ප්‍රතිපාදන අන්තර්ජාතික නීතියට පටහැනි වන ආකාරයට සිවිල් සමාජයේ වැඩ කටයුතු වලට බාධාවන හෝ අනතුරු දායක ලෙස යොදා ගෙන ඇත.''

## 4.3 නීතියෙන් පරිබාහිර හිරිහැර කිරීම, බියවැද්දීම සහ පලිග ැනීම්

නිත්‍යානුකූලව පැනවූ සීමාවන්ට සහ හිතුවක්කාරව යෙදෙන නීතිවලට අමතරව, සිවිල් සමාජ අවකාශය සීමා කළ හැකි, ඉලක්ක කර ගත් සිවිල් සමාජ ක්‍රියාකාරීන් හෝ ඔවුන්ගේ පවුල් වලට නිදහසේ ක්‍රියා කිරීම වැළැක්වීමේ තර්ජන හෝ වෙනත් ආකාරයේ මානසික පීඩා හෝ කායික ප්‍රහාර.

නිදසුන් වන්නේ:

- තර්ජනාත්මක දුර කතන පණිවුඩ
- සෝදිසියෙන් සිටීම
- කායික හෝ ලිංගික ප්‍රහාර
- දේපොළ විනාශ කිරීම
- සේවා නියුක්තිය හෝ ආදායම අහිමි කිරීම
- සිවිල් සමාජ ක්‍රියාකාරීන් 'රාජ්‍යයේ සතුරන්', 'ද්‍රෝහීන්' හෝ 'විදේශිකයන් සඳහා' වැඩ කරන අය ලෙස හඳුන්වා මඩ ගැසීමේ ව්‍යාපාර
- අතුරුදහන් කිරීම්
- වධ හිංසා පැමිණවීම්
- මිනී මැරුම්

''ජනතාව සහ සිවිල් සමාජ කණ්ඩායම් අනෙකුත් අයගේ ජීවිත නගා සිටුවීමට තමන්ගේ ජීවිත අනතුරට ලක් කරති. සදහටම නිහඬ කරවන බව දැන සිටියත් ඔවුහු අනෙක් අය වෙනුවෙන් කතා කරති. ඔවුහු අනෙක් අය නොසලකා හරින හෝ පවතින බවක් නොදන්නා ප්‍රශ්න ඉස්මතු කර දක්වති. ඔවුහු අනෙක් අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කරති. ඔවුන්ගේ අයිතිවාසිකම් ද රැකිය යුතුය. ''

2013 සැප්තැම්බර් 23 සිවිල් සමාජයට සහාය දැක්වීමේ ඉහළ මට්ටමේ උත්සවයේ දී එ ජා

මහ ලේකම් බැන් කිමුන් දක් වූ අදහස් වලින්

හිරිහැර කිරීම, තර්ජනය කිරීම සහ පලිගැනීම නිසා මානව අයිතිවාසිකම් ක්‍රියාකාරීන් තම අදහස් පළ කිරීමේ දී සහ එක්සත් ජාතින් සහ අනෙකුත් අන්තර්ජාතික ක්‍රියාකාරීන් සමග වැඩ කිරීමේ දී පීඩණයක් ඇති කරවයි. එමෙන්ම මෙම ක්‍රියා නිසා මහ ජනතාව තුළ බියක් ඇති කරවීමෙන් ප්‍රජාතන්ත්‍රීය සමාජයක් සඳහා අත්‍යවශ්‍ය වන ප්‍රකාශ කිරීම, සංගම් පැවැත්විම සහ සාමකාමී රැස්වීමේ නිදහස යටපත් කොට මර්දනකාරී වාතාවරණයක් නිර්මාණය කරයි.

තානාපතිනිය ලෝරා ඩුපෝ ලසාරේ
එක්සත් ජාතින්ගේ ජිනීවා කාර්යාලයේ උරුගුවේ නිත්‍ය නියෝජිත සහ මානව
අයිතිවාසිකම් මණ්ඩලයේ සභාපතිනිය ( 2011-2012 )

## මානව අයිතිවාසිකම් ආරක්ෂිකාවෝ

මානව අයිතිවාසිකම් ආරක්ෂිකාවන්ට ද (WHRDs) පුරුෂ අයට මුහුණ දීමට ඇති ආකාරයේ අනතුරුවලට ලක්විය හැකි අතර සුවිශේෂීව ඔවුන් ස්ත්‍රී පුරුෂ භාවීය තර්ජනවලට සහ ස්ත්‍රී පුරුෂ භාවීය ප්‍රචණ්ඩත්වයට ඉලක්ක කර ගැනීම සිදු වේ. මානව අයිතිවාසිකම් ආරක්ෂිකාවන්ගේ වැඩ කටයුතු බොහෝ විට සමාජයේ පවුල සහ ස්ත්‍රී පුරුෂ භූමිකාවේ සම්ප්‍රදායික මිණුම්වලට අභියෝගයක් ලෙස සැලකෙන නිසා සාමාන්‍ය ජනතාවගේ සහ බලධාරීන්ගේ විරෝධයට හේතු විය හැකිය. මානව අයිතිවාසිකම් ආරක්ෂිකාවන් ඔවුන්ගේ ක්‍රියාකාරිත්වයෙන් ආගම, ගෞරවය හෝ සංස්කෘතියට තර්ජනයක් වන්නේයැයි සිතන ප්‍රජා නායකයන්, ආගමික කණ්ඩායම්, පවුල සහ ප්‍රජාවන් විසින් ගර්හාවටත් පිළිකුල් කිරීමටත් හේතු විය හැකිය.

ඊට අමතරව ඔවුන්ගේ වැඩ කටයුතු හෝ ඔවුන් සාක්ෂාත් කර ගැනීමට උත්සාහ කරන දේ නිසා ( නිදසුනක් වශයෙන් ස්ත්‍රී අයිතිවාසිකම් හෝ වෙනත් ස්ත්‍රී පුරුෂ භාවීය අයිතිවාසිකමක් සාක්ෂාත් කර ගැනීම) ඔවුන් ප්‍රහාරයන්ට ඉලක්ක විය හැකිය. මානව අයිතිවාසිකම් ආරක්ෂිකාවන් හුදකලා කිරීම සහ තම වැඩ කටයුතු සිදු කිරීම අධෛර්යට පත් කිරීමේ අරමුණෙන් ඔවුන්ගේ පවුල් ද තර්ජන හා ප්‍රචණ්ඩත්වයේ ඉලක්ක විය හැකිය. මානව අයිතිවාසිකම් ආරක්ෂිකාවන් පුරුෂ අයට වඩා සමහර ආකාරයේ ප්‍රචණ්ඩත්වයට, අගතිගාමීවීම, කොන් කිරීම සහ ප්‍රතික්ෂේප කිරීම වැනි වෙනත් උල්ලංඝනය කිරීම්වලට ලක්වීමේ අනතුරක් ද පවතී. ප්‍රදේශීයව සහ අන්තර්ජාතික මට්ටමෙන් ඔවුන්ගේ ආරක්ෂාව සඳහා වූ යාන්ත්‍රණයන් සහ වෙනත් ප්‍රතිචාර ශක්තිමත් කිරීමට මෙම විශේෂිත අභියෝග පිළිගත යුතුය. මානව අයිතිවාසිකම් ආරක්ෂිකාවන්ට එරෙහිව රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් සිදු කරන බියවැද්දීම්, තර්ජන, ප්‍රචණ්ඩත්වය සහ වෙනත් අපහරණ ගැන කඩිනම් සහ පූර්ණ පරීක්ෂණ සිදු කළ යුතුය.

2013 දී එ ජා මහා මණ්ඩලය මානව අයිතිවාසිකම් ආරක්ෂිකාවන් සම්බන්ධයෙන් පළමු වරට සියලුම වයස් කාණ්ඩවලට අයත් මානව අයිතිවාසිකම් ආරක්ෂිකාවන් මුහුණ දෙන පද්ධති සහ ව්‍යුහාත්මක වෙනස් කොට සැලකීම් සමහරක් පිළිබඳව සිය කණස්සල්ල ප්‍රකාශ කොට යෝජනාවක් සම්මත කර, යෝජනා අංක 68/181,

මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂිත සහ ශක්තිමත් පරිසරයක් නිර්මාණය කිරීම සඳහා වූ ප්‍රයත්නයන්ට මානව අයිතිවාසිකම් ආරක්ෂිකාවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමටත් ස්ත්‍රී පුරුෂ දැක්මක් අන්තර්ග්‍රහණය කිරීමටත් සියලු පියවර ගන්නා ලෙස රාජ්‍යයන්ගෙන් ඉල්ලා සිටී.

අයිවරි කෝස්ට් හි 2014 සම්මත කළ මානව අයිතිවාසිකම් ආරක්ෂකයන් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීමේ නීතිය අනුව, ප්‍රකාශ කිරීමේ නිදහස, සංගම් සහ රාජ්‍ය නොවන සංවිධාන පිහිටුවීමේ අයිතිය, සම්පත් ලබා ගැනීමේ අයිතිය, අන්තර්ජාතික ආයතනවලට තොරතුරු සැපයීමේ අයිතිය සහ පලිගැනීම්වලින් ආරක්ෂා කරනු ලැබීමේ අයිතිය ඇතුළත් මානව අයිතිවාසිකම් ආරක්ෂකයන්ගේ ප්‍රකාශනයෙන් පිළිගෙන ඇති බොහෝ අයිතීන් ඇතුළත්ය. මෙම නීතියට මානව අයිතිවාසිකම් ආරක්ෂකයන්, ඔවුන්ගේ පවුල් සහ ඔවුන්ගේ නිවෙස් ප්‍රහාරවලින් ආරක්ෂා කිරීමටත්, එවැනි ප්‍රහාර සිදු වන්නේ නම් විමර්ශනය කර වැරදිකරුවන්ට දඬුවම් දීමටත් ඇති බැඳීම ඇතුළත් ය. මානව අයිතිවාසිකම් ආරක්ෂිකාවන් මුහුණ දෙන විශේෂිත තර්ජන සහ ඔවුන් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය එම නීතියෙන් පිළිගනී. අයිවරි කෝස්ට් රජයේ මෙම නිතිය අයිවරි කෝස්ට් මානව අයිතිවාසිකම් ආරක්ෂකයන්ගේ එකතුව, සහ බටහිර අප්‍රිකානු මානව අයිතිවාසිකම් ආරක්ෂකයන්ගේ ජාලය ඇතුළු සිවිල් සමාජ සංවිධාන සතුටින් පිළිගෙන ඇත.

## එක්සත් ජාතීන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම නිසා පුද්ගලයන් සහ සංවිධාන බියවැද්දීම සහ පලිගැනීම්වලට ලක් කිරීම.

''එක්සත් ජාතීන්ගේ වැඩ කටයුතු ඉදිරියට ගෙන යෑම සඳහා සිවිල් සමාජය මානව අයිතිවාසිකම් සඳහා පමණක් නොව සාමය සහ ආරක්ෂාව මෙන්ම සංවර්ධනය සඳහාත් වන අපගේ න්‍යාය පත්‍රයට කේන්ද්‍රීය වේ. මීට පෙර කිසි දිනක සිවිල් සමාජය මෙතරම් වැදගත් හෝ අවශ්‍ය වූයේ නැත. එක්සත් ජාතීන් සමග සහයෝගයෙන් කටයුතු කරන පුද්ගලයන් බිය වැද්දීම සහ ඔවුන්ගෙන් පලිගැනීම පිළිගත නොහැක්කේ ඔවුන් ප්‍රඥප්තියෙන් සහ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයෙන් පැවරෙන වැඩ කටයුතු ඉටු කිරීමට අපට උදවු වන නිසාම නොව ඒවායින් අනෙකුත් අය ද අප සමග වැඩ කිරීම අධෛර්යට පත් කරවන නිසාය. සෑම මට්ටමකම ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට අප පියවර ගත යුතුය.''

2013 සැප්තැම්බර් 23 සිවිල් සමාජයට සහාය දැක්වීමේ ඉහළ මට්ටමේ උත්සවයේ දී එ ජා මහ ලේකම් බැන් කිමුන් දැක් වූ අදහස් වලින්

''අප සමග සහයෝගයෙන් කටයුතු කරන අය නොවන්නට එක්සත් ජාතින්ට තම අගනා කාර්යය ඉටු කළ නොහැකිය. ඔවුන් බියවැද්දීමට හෝ පලිගැනීම්වලට ලක් වූ විට ඔවුන් ද වින්දිතයන් වන අතර අපට

ආරක්ෂාවක් නැති වනු ඇත. ඔවුන්ගේ සහයෝගිතාවය වැළැක්වීමෙන් මානව අයිතිවාසිකම් ක්ෂේත්‍රයේ අපගේ වැඩ කටයුතු අඩපණ වන්නේය.''

එ ජා මහ ලේකම් බැන් කිමූන්,

පලිගැනීම් පිළිබඳ ඉහළ මට්ටමේ සාකච්ඡා මණ්ඩපයේ ප්‍රකාශනය, 2011 නිව්යෝර්ක්.

මානව අයිතිවාසිකම් ක්ෂේත්‍රයේ එක්සත් ජාතින්ට සහයෝගය දක්වන පුද්ගලයන් හෝ කණ්ඩායම් වලට එරෙහිව සිදු කෙරෙන බිය වැද්දීම් සහ පලිගැනීම් විශේෂයෙන්ම කම්පාවට හේතු වේ. එක්සත් ජාතින්ගේ මානව අයිතිවාසිකම් පද්ධතියේ වැඩ කටයුතුවලට පුද්ගලයන්ගේ සහ කණ්ඩායම්වල සහභාගිත්වයේ අවශ්‍යතාවය සහ එම අයිතිය ගැන ලෝකයේම පිළිගැනීමක් පවතින නමුත් එවැනි සිද්ධීන් දිගටම වාර්තාවේ.

එක්සත් ජාතීන්ගේ යාන්ත්‍රණ හෝ නිලධාරීන් සමග සම්බන්ධවීම නිසා ( ප්‍රකාශන, සැල කිරීම්, රැස්වීම් වැනි) තනි සිවිල් සමාජ ක්‍රියාකාරීන් ඉහළ මට්ටමේ බලධාරීන්ගේ ප්‍රසිද්ධ ප්‍රකාශන ඇතුළුව ආණ්ඩුවේ නිලධාරීන්ගේ තර්ජන හා හිරිහැරවලට ලක්වීම වැනි, නැතිනම් රැස්වීම්වලට සහභාගිවීමට යෑම වැළැක්වීම සහ ඔවුන්ගේ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීම හෝ සීමා කිරිම තුළින් සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට බියවැද්දීමට හෝ පලිගැනිම්වලට මුහුණ දීමට සිදු වනු ඇත. සමාජ මාධ්‍ය, මුද්‍රිත හෝ රූපවාහිනී වැනි මාධ්‍ය තුළින් කෙරෙන මඩ ගැසීමේ ව්‍යාපාර අසාමාන්‍ය දෙයක් නොවේ. තර්ජන දුරකතන ඇමතුම්, කෙටි පණිවුඩ හෝ සෘජුවම කෙරෙන තර්ජන විය හැකිය. සිවිල් සමාජ ක්‍රියාකාරීන් අත් අඩංගුවට ගැනීම, ඔවුන්ට පහර දිම, වධ හිංසා පැමිණවිම හෝ මරා දැමීම පවා විය හැකිය.

මානව අයිතිවාසිකම් මණ්ඩලය මෙම කරුණ ගැන 24/24 යෝජනාව සහ 12/2 යෝජනාව ඇතුළත් යෝජනා ගණනාවක් සම්මත කර ඇත. මහ ලේකම් වාර්ෂිකව මානව අයිතිවාසිකම් ක්ෂේත්‍රයේ එක්සත් ජාතින් සමග සහයෝගයෙන් කටයුතු කිරීම නිසා පලිගැනිමට ලක් වූයේයැයි කියන සිද්ධීන් ගැන වාර්තා කරයි. මහ ලේකම් සහ මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් යන දෙදෙනාම මෙවැනි පලිගැනීම් පිළිගත නොහැකි බව නැවත නැවතත් අවධාරණය කොට එවැනි ක්‍රියා පිළිබඳව එක්සත් ජාතින්ගේ ඒකාබද්ධ සහ සම්බන්ධීකරණය වූ ප්‍රතිචාරයක් අවශ්‍ය වන්නේයැයි පැවසූහ. අනෙකුත් මානව අයිතිවාසිකම් යාන්ත්‍රණ ද පලිගැනීම්වලට විරුද්ධව ප්‍රබල සහ ප්‍රසිද්ධ ස්ථාවර ගෙන ඇත.

## පලිගැනීම් පිළිබඳව මානව අයිතිවාසිකම් ගිවිසුම්වල ඇති ප්‍රතිපාදන.

**ආර්ථික, සමාජයීය, සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සන්ධානයේ වෛකල්පික මූල පත්‍රය 13 වගන්තිය**

රාජ්‍ය පාර්ශ්වයක් එහි අධිකරණ බලයට යටත් පුද්ගලයන් මෙම මූල පත්‍රයට අනුකූලව කොමිටිය සමග සන්නිවේදනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස කිසිම

ආකාරයක හිංසාවන්ට හෝ බිය වැද්දීම්වලට ලක් නොවන බව තහවුරු කිරීමට සුදුසු සියලු පියවර ගත යුතුය.

**සන්නිවේදන ක්‍රියා පටිපාටි පිළිබඳව ළමයාගේ අයිතිවාසිකම් පිළිබඳ සන්ධානයේ වෛකල්පික මූල පත්‍රය 4 වගන්තිය.**

රාජ්‍ය පාර්ශ්වයක් එහි අධිකරණ බලයට යටත් පුද්ගලයන් මෙම මූල පත්‍රයට අනුකූලව කොමිටිය සමග සන්නිවේදනය කිරීමේ හෝ සහයෝගය දැක්වීමේ ප්‍රතිඵලයක් ලෙස කිසියම් මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමකට හෝ හිංසාවකට හෝ බිය වැද්දීමකට ලක් නොවන බව තහවුරු කිරීමට සියලු සුදුසු පියවර ගත යුතුය.

**ස්ත්‍රීන්ට එරෙහිව සියලු ආකාරයේ වෙනස් කොට සැලකීම් තුරන් කිරීම පිළිබඳ සන්ධානයේ වෛකල්පික මූල පත්‍රය 11 වගන්තිය**

රාජ්‍ය පාර්ශ්වයක් එහි අධිකරණ බලයට යටත් පුද්ගලයන් මෙම මූල පත්‍රයට අනුකූලව කොමිටිය සමග සන්නිවේදනය කිරීමේ හෝ සහයෝගය දැක්වීමේ ප්‍රතිඵලයක් ලෙස කිසියම් හිංසාවකට හෝ බිය වැද්දීමකට ලක් නොවන බව තහවුරු කිරීමට සියලු සුදුසු පියවර ගත යුතුය.

**ඔස්ත්‍රියාවේ** 1982 ඔම්බුඩ්ස්මන්ඩ් මණ්ඩල පනතේ 18 ඡේදය අනුව: ''වධ හිංසා වැළැක්වීම පිළිබඳ අනුකමිටුවට, ඔම්බුඩ්ස්මන්ඩ් මණ්ඩලයට හෝ එමගින් පිහිටුවන කොමිසන් සභාවලට තොරතුරු ලබා දීම නිසා කිසිම පුද්ගලයෙකු දඬුවම් කිරීමකට හෝ වෙනත් ආකාරයේ අනර්ථයකට ලක් නොකළ යුතුය.''

**මොන්ටිනෙග්‍රො** 2007 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56 වගන්තිය අනුව: ''සෑම පුද්ගලයෙකුටම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කළ අයිතිවාසිකම් සහ නිදහස ආරක්ෂා කර ගැනීම සඳහා අන්තර්ජාතික ආයතනවල පිහිට පැතීමට අයිතිය තිබිය යුතුය.''

හිරිහැර කිරීම්, බිය වැද්දීම් සහ පලිගැනීම් හා බැඳුණු නෛතික සහ පරිපාලන සීමා කිරීම් සිවිල් සමාජය රජය සමග ඉටු කළ යුතු නිර්මාණාත්මක සහ අනුපූරක හවුල්කාරී භූමිකාව ලුහු කරවයි. ඔවුන්ගේ අරමුණ වන්නේ සිවිල් සමාජයේ වැඩවල බලපෑම වැළැක්වීම, අවම කිරීම, අපහාසයට ලක් කිරීම, නතර කිරීම හෝ ආපසු හැරවීමයි. මෙම අවකාශය ප්‍රවර්ධනය කිරීමට සහ ආරක්ෂා කිරීමටත් සුරක්ෂිත සහ ශක්තිමත් වාතාවරණයක් තහවුරු කිරීමටත් අපොහොසත්වීම අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය යටතේ රාජ්‍ය යුතුකම්වලට පටහැනිය.

සිවිල් සමාජ ක්‍රියාකාරීන් ආරක්ෂා කිරීමේ මූලික වගකීමක් රාජ්‍යයන් සතුය. එහෙත් මානව අයිතිවාසිකම් ප්‍රගමනය සඳහා කෙරෙන තම වැඩ කටයුතු නිසා සිවිල් සමාජ අවකාශය හෝ සිවිල් සමාජ ක්‍රියාකාරීන් අනතුරට පත් වන්නේනම් ඔවුන්ට සහාය දීමට හා ආරක්ෂා කිරීමට අන්තර්ජාතික ප්‍රජාවේ පොදු වුවමනාවක් සහ වගකීමක් පවතී.

# 5. මට කළ හැක්කේ කුමක් ද? එක්සත් ජාතීන් වෙත යොමුවීම

අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතියෙන් සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට සහාය සහ මගපෙන්වීම් ලබා ගැනීම සඳහා යොමු විය හැකි සුවිශේෂී අන්තර්ජාතික වේදිකාවන් සපයයි. මානව අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ ලේකම් කාර්යාලය, (OHCHR) මානව අයිතිවාසිකම් ගිවිසුම් ආයතන සහ මානව අයිතිවාසිකම් මණ්ඩලය සහ එහි යාන්ත්‍රණ (විශේෂ ක්‍රියා පටිපාටි මැන්ඩේට් බලතල, කාලීන ගෝලීය සමාලෝචන යනාදියයි.)

"අන්තර්ජාතික මානව අයිතිවාසිකම් ප්‍රමිතීන් අන්තර්ජාතිකව එකඟ වූ නියමයන් සාක්ෂාත් කර ගැනීම සඳහා පෙනී සිටිමට සිවිල් සමාජය ශක්තිමත් කෙරෙන ගෝලීය ආකෘති රාමුවක් සපයයි. මෙම ප්‍රමිතීන් සිවිල් සමාජ ක්‍රියාකාරකම්වලට සුජාතභාවයක් ලබා දීමට අමතරව රාජ්‍යයන්හි මානව අයිතිවාසිකම් බැඳීම් ස්වාධීනව නිරීක්ෂණය කිරීමට සහ වාර්තා කිරීමට ප්‍රයෝජනවත් වේදිකාවක් සපයයි. අන්තර්ජාතික මානව අයිතිවාසිකම් යාන්ත්‍රණ සිවිල් සමාජය වඩාත් ශක්තිමත් කරවන පරිසරයක් වෙනුවෙන් පෙනී සිටීමට අත්‍යාවශ්‍ය වූ වේදිකාවක් ලෙස ඉස්මතුව ඇත. විශේෂයෙන්ම සීමා බන්ධන වලින් යුත් සන්දර්භයක් තුළ එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් ආයතන, සංවේදී කරුණු පිළිබඳව දැනුවත් භාවය ඇති කිරීමට සහ සංවාදයක් සඳහා ජාතික සිවිල් සමාජ කණ්ඩායම්වලට අතිශයෙන් වැදගත් පිවිසුමක් ලබා දේ."

ආචාර්ය ඩැනි ශ්‍රීස්කන්ධරාජා,
මහ ලේකම් CIVICUS: පුරවැසි සහභාගිත්වය සඳහා ජගත් සන්ධානය,
2014 ඔක්තෝබර්.


මාර්ග දෙකකින් එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් යාන්ත්‍රණ හරහා සිවිල් සමාජ අවකාශය ආරක්ෂා කළ හැකිය.[4]

**සිවිල් සමාජ අවකාශයට සහ යහ භාවිතයට ඇති බාධක,** තර්ජන පිළිබඳව ලේඛනගත කිරීම: මානව අයිතිවාසිකම් තත්වය පිළිබඳව ලේඛනගත කිරීම එ ජා යාන්ත්‍රණය විසින් කෙරෙන මැදිහත්වීමක පදනම වේ. සිවිල් සමාජ ක්‍රියාකාරීන් විසින් ඉදිරිපත් කරන නිවැරදිව ලේඛන ගත කළ සහ සත්‍යතාවය තහවුරු කළ තොරතුරු, ක්‍රියාත්මක වීමට ප්‍රබල හේතුවක් වන අතර මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනයට සහ ආරක්ෂා කිරීමට වඩාත් විශ්වාසදායී සහ ඒත්තු ගන්වන බලවත් ආකාරයක් ද වේ. සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට සහ ඔවුන්ට වැඩ කිරීමට ඇති අවකාශය මෙන්ම යහපත් භාවිතා එ ජා යාන්ත්‍රණයන්ට සන්නිවේදනය කිරීමටත් පවතින බාධක තර්ජන ගැන ඇති ලේඛන ගත කිරීම් (නිවැරදි, සත්‍ය තොරතුරු, පරීක්ෂාකාරී විග්‍රහයන් සහ නිශ්චිත නිර්දේශ) හුවමාරු කර ගැනිමට ආරාධනය කෙරේ.

[4] මෙම යාන්ත්‍රණවල ප්‍රධාන ලක්ෂණ පිළිබඳව දැනටමත් පළපුරුද්දක් නැති පාඨකයන්ට OHCHR සිවිල් සමාජය සඳහා අත්පොතක් එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසාකම් වැඩ සටහන සමග වැඩ කිරීම පරිශීලනය කිරීමට ඇරයුම් කෙරේ. වැඩිදුර මගපෙන්වීම් සහ උපදෙස් එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් නිර්දේශ පිළිබඳව පසුවිපරම් කරන්නේ කෙසේද යන්න ඇතුළුව සිවිල් සමාජය සඳහා ප්‍රායෝගික මගපෙන්වීම් මාලාවෙන් ලබා ගත හැකිය.

**පවතින අවකාශය යොදා ගැනීම:** සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට අන්තර්ජාතික සම්මන්ත්‍රණ සහ රැස්වීම්වලට හෝ විශේෂඥයන්ගේ පැමිණීමේ අවස්ථාවලට සහභාගිවීමේ අවකාශය යොදා ගන්නා ලෙසද ඉල්ලීමක් කෙරේ. සිවිල් සමාජ අවකාශය පිළිබඳ ගැටලු ගැන දැනුවත් භාවය වැඩි කිරීමට මෙන්ම නිර්දේශ, සාර්ථකවූ උපාය මාර්ග හුවමාරු කර ගැනීමට සැල කිරීම්, සාකච්ඡා සංවිධානය කිරීම හා සහභාගිවන්නන් අතර ජාල ගොඩ නැගීම හරහා අවස්ථා ලබා ගත හැකිය.

සිවිල් සමාජ අවකාශයේ පවතින ගැටලු ගැන එ ජා මානව අයිතිවාසිකම් යාන්ත්‍රණ සමග වැඩ කිරීමෙන්, සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට සිවිල් සමාජ අවකාශය ආරක්ෂා කිරීමේ සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් ප්‍රදේශීයව බලගැන්වීම සඳහා වූ තම වැඩ කටයුතුවලදී මෙම නිමැවුම් (අන්තර්ජාතික සොයා ගැනීම් සහ රාජ්‍යයන්ට නෛතික, පරිපාලනමය සහ වෙනත් පියවර ගැන කරන ලද නිර්දේශ) යොදා ගැනීමේ අවස්ථාවක් පවතී.




එ ජා මානව අයිතිවාසිකම් මැන්ඩේට් බලතල සහ යාන්ත්‍රණවල නිමැවුම් පිළිබඳ නිදසුන්:

- ගිවිසුම් ආයතනවල අවසාන නිරීක්ෂණ මෙන්ම එක් එක් සිද්ධීන් පිළිබඳ අදහස් සහ නිර්දේශ
- එක් එක් රටවල සංචාරය කිරීමෙන් පසු සකස් කෙරෙන වාර්තාවල අඩංගු තක්සේරු, නිර්දේශ සහ නිගමන, යම් යම් කරුණු පිළිබඳ වාර්තා සහ මානව අයිතිවාසිකම් මණ්ඩලයේ විශේෂ ක්‍රියා පටිපාටි ( ස්වාධීන විශේෂඥයන්) විසින් එක් එක් සිද්ධීන් පිළිබඳව කරන නිර්දේශ
- විශ්ව කාලීන සමාලෝචනවල නිර්දේශ
- මානව අයිතිවාසිකම් මණ්ඩලයේ සහ මහා සභාවේ යෝජනා සහ තීරණ
- පරීක්ෂණ කොමිෂන් සභා, තොරතුරු සෙවීමේ දූත මෙහෙය වාර්තා සහ මානව අයිතිවාසිකම් මණ්ඩලය විසින් ස්ථාපනය කරන ලද වෙනත් තත් කාර්ය මානව අයිතිවාසිකම් විමර්ශන යාන්ත්‍රණ
- එ ජා මහ ලේකම් ගේ ප්‍රකාශන

- මානව අයිතිවාසිකම් පිළිබඳ එ ජා මහ කොමසාරිස් ගේ ප්‍රකාශ, වාර්තා සහ අධ්‍යයන (එනම් ක්ෂේත්‍රයේ සිටින අයගේ ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තා, මානව අයිතිවාසිකම් මණ්ඩලයේ හෝ එ ජා මහා මණ්ඩලයේ මැන්ඩේට් බලය අනුව නියම කළ කරුණු පිළිබඳ වාර්තා සහ අධ්‍යයන)
- මානව අයිතිවාසිකම් ක්ෂේත්‍රයේ එක්සත් ජාතීන් සමග සහයෝග යෙන් කටයුතු කරන පුද්ගලයන් හෝ කණ්ඩායම්වලට එරෙහිව බිය වැද්දීම්හෝ පලිගැනීමේ සිද්ධීන් පිළිබඳ මහ ලේකම් ගේ වාර්ෂික වාර්තාව.
- මහ ලේකම්, මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් හෝ මානව අයිතිවාසිකම් පිළිබඳ විශේෂඥයන් ප්‍රසිද්ධ ප්‍රකාශනවලින් කෙරෙන ඉල්ලීම්.


මෙම සොයා ගැනීම් සහ නිර්දේශ ප්‍රාදේශීය ක්‍රියාකාරකම්වලට සහායවීමේ සහ හැඩ ගැස්වීමේ දී මෙන්ම ආරක්ෂා කිරීමේ දී යෝජනා කිරීමේ සහ මගපෙන්වීමේ ප්‍රබල මෙවලම් විය හැකිය. නිදසුන් වශයෙන් සිවිල් සමාජ ක්‍රියාකාරිකයෙකුට:

- එ ජා මානව අයිතිවාසිකම් පද්ධතියෙන් කරන ලද නිර්දේහ ක්‍රියාත්මක කිරීම පිළිබඳව මධ්‍යම සහ ප්‍රාදේශීය ආණ්ඩු සමග ක්‍රියා කළ හැකිය.
- රටේ මානව අයිතිවාසිකම් භාවිතා ගැන පවතින අන්තර්ජාතික විශ්ලේෂණ සහ අපේක්ෂා පිළිබඳව ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ දැනුවත්භාවය නගා සිටුවිම
- මධ්‍යම සහ ප්‍රාදේශීය මට්ටමේ දී බලධාරීන් විසින් දක්වන ලද ප්‍රතිචාර සහ ගනු ලැබූ පියවර අධීක්ෂණය සහ ඇගයීම
- සාක්ෂි සහිත, විෂය මූලික භාෂාවකින් ප්‍රබල උපාය මාර්ග සහ යහපත් භාවිතා හරහා දැනට පවතින ප්‍රචාරාත්මක ලිපි ලේඛන ශක්තිමත් කිරීම.
- සිවිල් සමාජ සංවිධාන තුළ හා ඒ අතර මෙන්ම මහජනතාව අතර මතයක් ඇති කිරීම
- හවුල්කාරිත්ව ගොඩ නැගීම
- රාජ්‍ය නිලධාරීන් සමග සංවාදයේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම
- ප්‍රතිපත්ති සම්පාදනයට දායකවීම
- නීතිමය පියවර/ නඩු කටයුතු පටන් ගැනිම
- මානව අයිතිවාසිකම් යාන්ත්‍රණයේ පසුවිපරම් ක්‍රියා පටිපාටිවලට දායකවීම
- එ ජා මානව අයිතිවාසිකම් යාන්ත්‍රණයන්ට පුද්ගලිකව පැමිණිලි කිරීමට අදහස් කරන පුද්ගලයන්ට තාක්ෂණ උපදෙස් ලබා දීම සහ ඒවා තක්සේරු කිරීම

වෙනත් රටවලට අදාල එක්සත් ජාතීන්ගේ සොයා ගැනීම්, වෙනත් ස්ථානවල සමාන අත්දැකීම්වලට අදාල උපාය මාර්ග පිළිබඳව සාරවත් තොරතුරු මූලාශ්‍ර වේ.

## එ ජා මානව අයිතිවාසිකම් යාන්ත්‍රණ ක්‍රියා කරන්නේ කෙසේද?

පොදුවේ එ ජා මානව අයිතිවාසිකම් යාන්ත්‍රණ මානව අයිතිවාසිකම් ප්‍රශ්න විසඳීමට උත්සාහ කිරීමේ දී සමාන ක්‍රියා පිළිවෙතක් අනුගමනය කරයි. තොරතුරු සිවිල් සමාජ ක්‍රියාකාරීන් ඇතුළු මූලාශ්‍ර ගණනාවකින් රැස් කිරීම හෝ ලබා ගැනීම සිදු කෙරේ. ඒවා ගැලපීම, විශ්වසනීයත්වය සහ නිරවද්‍යතාවය ගැන නැවත පරීක්ෂා කර බලා විශ්ලේෂණය කෙරේ. මෙම යාන්ත්‍රණය ඇරඹෙන්නේ තොරතුරුවල සත්‍යතාවය ගැන රජය සමග ලිඛිතව හෝ පුද්ගලිකව සංවාදයක් ඇරඹීමෙනි. ගැටලුව විසඳන්නේ කෙසේද යන්න පිළිබඳව රාජ්‍යයට නිර්දේශ ඉදිරිපත් කර නිර්දේශ ක්‍රියාත්මක කිරීමට සහාය ලබා දීමට ඉදිරිපත් වනු ඇත. ඉන් පසුව නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රගතිය තක්සේරු කිරීමට තව දුරටත් තොරතුරු රැස් කරනු ඇත.



2011 අප්‍රේල් මස ස්පාඤ්ඤයේ ආබාධයන් සහිත පුද්ගලයන්ගේ නියෝජිත කොමිටියේ සාමාජිකයෝ (CERMI) ආබාධයන් සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ කොමිටියේ (CRPD) පස් වැනි සැසියට සහභාගි වී ගැටලු පිළිබඳ ලේඛනය සකස් කිරීමට දායක වූහ. ඔවුහු වාර්තාවක් ඉදිරිපත් කර කොමිටිය සමග සාකච්ඡා කිරීමෙන් පසුව ස්පාඤ්ඤයට යොමු කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම ගැන පසුවිපරම් කළහ. තම ආබාධිත තත්වය නිසා ඡන්ද අයිතිය අහිමි කරන ලද පුද්ගලයන්ගේ ඡන්ද අයිතිය නැවත ලබා ගැනීම සඳහා පුළුල් ව්‍යාපාරයක් දියත් කෙරිණ. මෙම ප්‍රශ්නය ඒ දිනවල ආසන්න වශයෙන් පුද්ගලයන් 80,000 කට පමණ බලපාන තත්වයකි. ආබාධය, නෛතික තත්වය හෝ වාසස්ථානය නොසලකා ආබාධයන් සහිත සියලු පුද්ගලයන්ට ඡන්ද අයිතිය ලබා දීමට අදාල සියලු ව්‍යවස්ථා සමාලෝචනය කළ යුතුයැයි කොමිටිය නිර්දේශ කළාය. (CRPD/C/ESP/CO/1 ඡේදය 48) CERMI ව්‍යවස්ථා සංශෝධනයට සහාය පිණිස, ඡන්දය දීමේ අයිතිය ලබා ගැනීමේ සහ භාවිතා කිරීමේ ප්‍රායෝගික පියවර විස්තර කෙරෙන "ඔබට ඡන්ද අයිතිය ඇත. කිසිවෙකුට එය ඉවත් කළ නොහැකිය" යනුවෙන් මගපෙන්වීමත් ඇතුළු මුලපිරුම් ගණනාවක්ම දියත් කෙළේය. CERMI මතවාදී ප්‍රචාරයේ ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ අභිචෝදක ආබාධයන් සහිත පුද්ගලයන්ගේ ඡන්ද අයිතිය ආරක්ෂා කරන මෙන් කලාපීය අභිචෝදකයන්ගෙන් ඉල්ලා සිටියේය. CERMI වැඩි දුරටත් CRPD අවසාන නිරීක්ෂණවලට අනුකූල වන ආකාරයට ව්‍යවස්ථා සංශෝධනය කරන ලෙස ආණ්ඩුවට සහ කොංග්‍රස් මණ්ඩලයට කරුණු දක්වූයේය. යෝජිත සංශෝධනයක් කොංග්‍රසයේ සහ ආණ්ඩුවේ නොයෙකුත් සාමාජිකයන්ට යවන ලදී.

සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට ප්‍රාදේශීය වශයෙන් ජනතාව පෙළ ගැසීමට සහ සිවිල් සමාජ අවකාශය ප්‍රවර්ධනයට සහ ආරක්ෂා කිරීමේ ජාතික උපාය මාර්ග සඳහා සහාය ලබා ගැනීමට අන්තර්ජාතික හඬ යොදා ගත හැකිය.

## මට කළ හැක්කේ කුමක්ද?

- ඔබගේ රටේ එ ජා මානව අයිතිවාසිකම් ලිපි ලේඛන පිළිබඳව දැනුවත්වීම සහ ඒවා හුවමාරු කර ගැනීම.

**http://www.ohchr/org/EN/Countries/pages/HumanRightsintheWorld.aspx**

- ආසන්නයේම ඇති ධ්‍යකාඝ කාර්යාලය හෝ එ ජා දේශීය කණ්ඩායම හමු වී සිවිල් සමාජ අවකාශය ගැන ඔබගේ අත්දැකීම් පිළිබඳ ඔබගේ වාර්තාව ධ්‍යකාඝ හි සිවිල් සමාජ අංශය සමග හුවමාරු කර ගන්න. **civilsociety@ohchr.org**
- මානව අයිතිවාසිකම් ගිවිසුම් මණ්ඩල වැඩ කටයුතුවලට දායක වන්නේ සහ සහභාගිවන්නේ කෙසේදැයි සොයා ගන්න.

**http://www.ohchr/org/Documents/Publications/Ngohandbook/ngohandbook4.pdf**

- මානව අයිතිවාසිකම් ගිවිසුමක් යටතේ, සුදුසු ආකාරයට අන්තර්වාර පියවර හෝ හදිසි පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිමින් පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම.

http://www.ohchr/org/Documents/Publications/factSheet7Rev.2.pdf

- මානව අයිතිවාසිකම් මණ්ඩලයේ විශේෂ ක්‍රියා පටිපාටි විශේෂඥයන්ට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම.

http://www.ohchr.org/EN/HRbodies/SP/Pages/Communications.aspx

- මානව අයිතිවාසිකම් මණ්ඩලයේ පැමිණිලි ක්‍රියා පටිපාටියට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම.

http://ohchr.org/EN/HRbodies/HRCComplaintProcedure/Pages/HRCComplaintProcedureIndex.aspx

- මානව අයිතිවාසිකම් මණ්ඩලයේ සැසි සමග සිවිල් සමාජ අවකාශයට අදාල ඔබගේ තොරතුරු සහ අත්දැකීම් හුවමාරු කර ගන්න.

http:www.ohchr.org/Documents/HRBodies/HRCouncil/PracticalguideNGO_en.pdf

- මානව අයිතිවාසිකම් මණ්ඩලයේ ඔබගේ රට පිළිබඳ කාලීන විශ්ව සමාලෝචනයේ සිවිල් සමාජ අවකාශයට අදාල තොරතුරු සහ අත්දැකීම් හුවමාරු කර ගන්න.

http://www.ohchr.org/Documents/HRBodies/HRCouncil/PracticalGuideCivilSociety.pdf

- පලිගැනීම් පිළිබඳ මහ ලේකම් ගේ වාර්ෂික වාර්තාවට දායකත්වයක් වශයෙන් එක්සත් ජාතීන්, එහි නියෝජිතයන් සහ මානව අයිතිවාසිකම් ක්ෂේත්‍රයේ එහි යාන්ත්‍රණ සමග සහයෝගයෙන් කටයුතු කිරීම නිසා කිසියම් පුද්ගලයෙකුට හෝ කණ්ඩායමකට එරෙහිව හිරිහැර කිරීම්, තර්ජනය කිරීම් හෝ පලිගැනීම් නිසා සිදු වූයේයැයි කියන හානිය සම්බන්ධයෙන් සවිස්තරාත්මක සහ සහතික කරන ලද තොරතුරු ලබා දීම reprisals@ohchr.org
- එක්සත් ජාතීන්ගේ මහ ලේකම් ගේ හෝ මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් ගේ නිශ්චිත කරුණු පිළිබඳ වාර්තාවලට තොරතුරු ලබා දීම.
- විශේෂ ක්‍රියා පටිපාටි නිශ්චිත කරුණු පිළිබඳ සහ දේශීය වාර්තාවලට තොරතුරු ලබා දීම

http://www.ohchr.org/Documents/Publications.NGOHandBook/ngohandbook6.pdf

- එ ජා මානව අයිතිවාසිකම් යාන්ත්‍රණ ක්‍රියාකාරකම් ගැන දැනුවත්ව සිටීම සඳහා සිවිල් සමාජ අංශයේ ඊ මේල් ලැයිස්තුවට දායකවීම

http:www.ohchr.orj/EN/AboutUs/Pages/CivilSociety.aspx

## අපේක්ෂා කළමනාකරණය


ප්‍රකාශ කිරීමේ, සංගම් පැවැත්වීමේ, සාමකාමී රැස්වීමේ නිදහස සහ මහජන කටයුතුවලට සහභාගිවීමේ අයිතිය ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීමේ මූලික වගකීම

පැවරෙන්නේ රාජ්‍යයන්ටය. එ ජා මානව අයිතිවාසිකම් පද්ධතිය සහ අනෙකුත් ක්‍රියාකාරීන් සමග එක්ව සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට මෙම බැඳීම් ඉටු කිරීමට රාජ්‍යයට ඉවහල් විය හැකිය.

සිවිල් සමාජ අවකාශයට නියමයන් හෝ නීතිය පදනම් බාධා විසඳීම්වලින් වෙනසක් ඇති කිරීම සඳහා සාමාන්‍යයෙන් දීර්ඝ කාල රාමුවක් අවශ්‍ය වන අතර සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට එරෙහිව සිදු කෙරෙන හිරිහැර, බියවැද්දීම් සහ පලිගැනීම් පිළිබඳව හදිසි අවධානය යොමු විය යුතුය. උද්ගතව ඇති ප්‍රශ්නය සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ අදාල මැන්ඩේට් බලය හෝ යාන්ත්‍රණ යොදා ගැනීම වැදගත්ය.

මෙම අවස්ථා දෙකේ දීම සාධනීය ප්‍රතිපලයක් සඳහා බලපෑම් කිරීමේ හැකියාව සාමුහික ප්‍රයත්නයක් වන අතර සාමාන්‍යයෙන් තීරණය කරනු ලබන්නේ ක්‍රියාකාරීන්, දේශීය ජනතාව, වෙනත් සිවිල් සමාජ ක්‍රියාකාරීන් (දේශීය සහ අන්තර්ජාතික) ජාතික මානව අයිතිවාසිකම් සංවිධාන, මාධ්‍යය, රාජ්‍ය නිලධාරීන්, දේශපාලකයන්, වෙනත් රටවල් සහ කලාපීය සහ අන්තර්ජාතික ප්‍රජාව ආදී වශයෙන් ක්‍රියාකාරීන් පුළුල් පිරිසක් පෙළ ගැසීමෙනි.

සිවිල් සමාජ ක්‍රියාකාරීන් එ ජා පද්ධතිය සමග සම්බන්ධවීම වෙනසක් සඳහා වූ හඬ වැඩි කිරීමට සහ උච්චත්වයට පත් කිරීමට මාර්ගයකි. එය සිවිල් සමාජ අවකාශය ප්‍රවර්ධනය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ සමස්ත ප්‍රචාරාත්මක උපාය මාර්ගයක මූලික කරුණුවලින් එකකි.



# 6. ප්‍රලේඛන සම්පත්

## එක්සත් ජාතීන්ගේ මූලාශ්‍ර

එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් වැඩ සටහන සමග වැඩ කිරීම: සිවිල් සමාජය සඳහා අත්පොතක්

http://www.ohchr.org/EN/Aboutus/CivilSociety/Documents/Handbook.en.pdf

එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් නිර්දේශ පිළිබඳව පසුවිපරම් කරන්නේ කෙසේද: සිවිල් සමාජය සඳහා ප්‍රායෝගික අත්පොතක්

http://www.ohchr.org/Documents/AboutUs/civilsociety/HowtoFollowUNHRrecommendations.pdf

OHCHR කළමනාකරණ සැලැස්ම (2014-2017) ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය පුළුල් කිරීම පිළිබඳ තේමා අනුව උපාය මාර්ග (පිටු 72-83)

http://www2.ohchr.org/english/OHCHRreport2014_2017/OMP_Web_version/media/pdf10_Democratic_space.pdf

මානව අයිතිවාසිකම් ආරක්ෂකයන් පිළිබඳ ප්‍රකාශනය

http://www.ohchr.org/EN/Issues/SRHRDefenders/Pages/Declaration.aspx

සිවිල් සමාජ අවකාශය ප්‍රවර්ධනය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ වැදගත්කම පිළිබඳ මානව අයිතිවාසිකම් මණ්ඩලයේ මණ්ඩප සාකච්ඡාවේ සාරාංශය A/HRC/27/33

මානව අයිතිවාසිකම් කොමිටියේ පොදු අදහස් අංක 34 වගන්තිය 19: මත දැරීමේ සහ ප්‍රකාශ කිරීමේ නිදහස CCPR/C/GC/34

සංගම් පැවැත්වීමේ නිදහසට අදාල ව්‍යවස්ථා පිළිබඳ තක්සේරුවක්, මානව අයිතිවාසිකම් ආරක්ෂකයන්ගේ තත්වය පිළිබඳ විශේෂ සම්බන්ධීකාරක වාර්තාව A/64/226

මානව අයිතිවාසිකම් ආරක්ෂිකාවන් පිළිබඳ අධ්‍යයනයක්, මානව අයිතිවාසිකම් ආරක්ෂකයන්ගේ තත්වය පිළිබඳ විශේෂ සම්බන්ධීකාරක වාර්තාව A/HRC/16/24

මානව අයිතිවාසිකම් ආරක්ෂකයන් සඳහා ආරක්ෂිත සහ ශක්තිමත් කරවීමේ පරිසරයක මූලික ලක්ෂණ. මානව අයිතිවාසිකම් ආරක්ෂකයන්ගේ තත්වය පිළිබඳ විශේෂ සම්බන්ධීකාරක වාර්තාව A/HRC/25/55

මූල්‍ය සම්පත් ලබා ගැනීමට සංගම්වලට ඇති හැකියාව, සාමකාමී රැස්වීමේ සහ සංගම් පැවැත්වීමේ නිදහසට ඇති අයිතිය පිළිබඳ විශේෂ සම්බන්ධිකාරක වාර්තාව A/HRC/23/39

මානව අයිතිවාසිකම් ක්ෂේත්‍රයේ එක්සත් ජාතීන්ගේ නියෝජිතයන් සහ යාන්ත්‍රණ සමග සහයෝගයෙන් කටයුතු කිරීම පිළිබඳව මහ ලේකම් ගේ වාර්තාව (A/HRC/27/38/, A/HRC/24/29, A/HRC/21/18, A/HRC/18/19, A/HRC/14/19)

16 පරිච්ඡේදය, සිවිල් සමාජය සමග සම්බන්ධවීම සහ හවුල්කාරිත්වය. මානව අයිතිවාසිකම් අධීක්ෂණය පිළිබඳ ධ්‍යකසෘ අත්පොත.

http://www/ohchr.org/Documents/Publications/Chapter16-MHRM.pdf

## තෝරාගත් සිවිල් සමාජ සහ අනෙකුත් මූලාශ්‍ර

ජාතික නීති සඳහා මූලධර්ම සහ මූලික ලක්ෂණ පරික්ෂා කිරීමේ ලැයිස්තුව ( නීති පිළිබඳ ලාභ නොලබන ජාත්‍යන්තර කේන්ද්‍රය)

http://www.icnl.org/research/library/files/Transnational/checklisten.pdf

තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී සිවිල් සමාජ සහභාගිවීමේ ආකාරයන් සඳහා වූ යහපත් භාවිතා පිළිබඳ නිති සංග්‍රහය, යුරෝපා මණ්ඩලය.

http://www.coe.int/t/ngo/code_good_prac_en.asp

පලිගැනීම් පිළිබඳ අත්පොත ( මානව අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සේවය)

http://www.ishr.ch/news/reprisals-handbook

ශක්තිමත් කරවීමේ පරිසර දර්ශකය 2013 (CIVICUS)

http://www.civicus.org/downloads/2013EEI%20REPRT,pdf

# 7. අප අමතන්න.

OHCHR's සිවිල් සමාජ අංශය පහත විද්‍යුත් ලිපිනයෙන් සම්බන්ධ විය හැකිය.

civilsociety@ohchr.org

දුර කතනය: +41 (0) 22 917 9656

සිවිල් සමාජ විද්‍යුත් තැපැල් ප්‍රචාර පද්ධතියෙන් මානව අයිතිවාසිකම් මැන්ඩේට් බලතල සහ යාන්ත්‍රණ ගැන මෙන්ම අරමුදල්, ප්‍රදාන සහ ශිෂ්‍යත්ව සඳහා අයැදුම් පත් පිළිබඳ තොරතුරු සහ අවසාන දින ගැන යාවත්කාලින කළ තොරතුරු සහ මඟපෙන්වීම් සපයයි.

ඒ සඳහා දායකවීමට අපගේ සිවිල් සමාජ වෙබ් පිටුවට පිවිසෙන්න.

http://www.ohchr.org/EN/AboutUs/Pages/CivilSociety.aspx



Made of paper awarded the European Union Eco-label, reg.nr FI/111/, supplied by UPM.

**සිවිල් සමාජය සඳහා ප්‍රායෝගික මගපෙන්වීමක්**
**සිවිල් සමාජ අවකාශය සහ එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පද්ධතිය**

**මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය**
Palais des Nations
CH 1211 Geneva 10- Switzerland
Telephone: + 41 (0)22 917 90 00
Fax: +41 (0) 22 917 90 08
www.ohchr.org

UNITED NATIONS

UNITED NATIONS
HUMAN RIGHTS
OFFICE OF THE HIGH COMMISSIONER